සැ. යු. - 2013.08.23 දින පළ වූ අංක 1,825 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටස යටතේ 2011 වර්ෂයේ අප්‍රේල් සිට ජුනි දක්වා කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,826 - 2013 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2013.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1314 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1316 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1321 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1322 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1328 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ.* තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය පළ වූ දින සිට* **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්,* 2013 සැප්තැම්බර් මස 20 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2013 සැප්තැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

යොමු අංකය : SRS/F 7039

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු සඳහා ආරාධනයයි

**ලියනගෙමුල්ල සිට කටුනායක දක්වා ද්විත්ව මාර්ගය ( කි. මී. 1.5) ඉදිකිරීම සඳහා. පස් පිරවීම, කැපීමේ වැඩ, හැඩ ගැසීම හා සනවත් කළ ඒබීසී තට්ටුව සහ ගල් ඇතිරීම සඳහා වන ප්‍රසම්පාදනය**

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, ලියනගෙමුල්ල සිට කටුනායක දක්වා ද්විත්ව මාර්ගය (කි. මී. 1.5) ඉදිකිරීම සඳහා, පස් පිරවීම, කැපීමේ වැඩ, හැඩ ගැසීම හා සනවත් කළ ඒබීසී තට්ටුව සහ ගල් ඇතිරීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලබන අතර, ලංසු භාරගැනීම, 2013.09.17 වැනි දින පස්වරු 2.00 ට අවසන් කරනු ලැබේ.

ආපසු ගෙවනු නොලබන ලිපිලේඛන ගාස්තු රුපියල් 3,000.00 ක් ගෙවීමෙන් 2013.09.16 වැනි දින පස්වරු 3.00 දක්වා, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

2. ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ (NCCASL) සාමාජිකත්වය දරන හා මහාමාර්ග ඉදිකිරීම් හා වාරිමාර්ග සහ ගොඩබිම් ජලාපවහන ක්ෂේත්‍රයේ, ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) සී 4 ශ්‍රේණිය හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචි අයවලුන්හට පමණක් ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලැබේ.

3. කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැකි ය.

4. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ දින සිට දින එකසිය විස්සක් (120) දක්වා වූ අවම කාලයක් සඳහා ලංසු වලංගු විය යුතු ය.

5. ලංසු සමග, රුපියල් 2,80,000.00 (රුපියල් දෙලක්ෂ අසූ දහසක් පමණක්) වටිනා ලංසු ඇපකරය බැගින් තිබිය යුතු ය.

6. මුද්‍රා තැබූ ලංසු, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන්, සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කොට් මාවත, කොළඹ 10 යන ලිපිනයට, අදාළ භාරගනු ලබන අවසන් වේලාවට පෙර ලැබීමට සැලැස්විය යුතු ය.

7. අදාළ භාර ගැනීමේ වේලාව අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (ප්‍රධාන) සභාපති, කාර්යාලයේ දී, ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන් හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

8. වැඩිදුර විස්තර සඳහා, කරුණාකර දුරකථන අංක 2438078 හෝ 2436818 මගින් දුම්රිය ගබඩා අධිකාරි අමතන්න.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

08-1067

---

යොමු අංකය : එස්ආර්එස්/එෆ්/7063.

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

මිලදී ගැනීමේ නිවේදනය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා දුම්රිය පීලි අතර පුරවන කුඩාගල් කියුබ් 6,000 ක් (6,000 cubes of track ballast) සැපයීම සඳහා මිල ගණන් කැඳවීම**

පහත සඳහන් ස්ථානයන් සඳහා දුම්රිය පීලි අතර පුරවන කුඩා ගල් සැපයීම සඳහා මුද්‍රා තබන ලද ලංසු 2013.09.05 වැනි දින ප. ව. 2.00 දක්වා කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (ප්‍රධාන) විසින් භාරගනු ලබයි. පහත සඳහන් එක් එක් අයිතමය සඳහා මෙම ලංසු ඇගයීම්කර ප්‍රදානය සිදු කරනු ඇත.

| *අයිතම* | *ස්ථානය* | *කියුබ් ගණන* | *භාරදිය යුතු කාලසීමාව* |
|---|---|---|---|
| 01. | ගනේවත්ත අංගනය | 1,000 | මාස 06 |
| 02. | නාගොල්ලාගම අංගනය | 1,000 | මාස 06 |
| 03. | පොතුහැර අංගනය | 1,000 | මාස 06 |
| 04. | කුරුණෑගල අංගනය | 1,000 | මාස 06 |
| 05. | වැල්ලවාය අංගනය | 1,000 | මාස 06 |
| 06. | කඩුගන්නාව අංගනය | 1,000 | මාස 07 |

02. රු. 3,000 ක ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තුවක් ගෙවීමෙන් 2013.09.04 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

03. 2013.09.05 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වෙයි.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය මූලස්ථානයේ දී ලංසු විවෘත කිරීම සිදු කරනු ලැබේ. ලංසු තබන්නන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණෙන ලෙස ආරාධනය කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතු යඃ-

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම ගාස්තු ගෙවීමකින් තොරව කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී සිදු කළ හැකි අතර වැඩිදුර විස්තර අංක 2438078 හෝ 2436818 දරන දුරකථන අංක මගින් දුම්රිය ගබඩා අධිකාරි වෙතින් විමසන්න. ෆැක්ස් අංකය 2432044.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

08-1071

යොමු අංකය : එස්ආර්එස්/එෆ්/7057.

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**නගරාන්ත හා දීර්ඝ දුර ධාවන දුම්රියවල දෙවන පංතියේ මැදිරිවල ආසනවල තත්ත්වය උසස් කරලීම සඳහා ප්‍රසම්පාදනය**

කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, වාහන අභ්‍යන්තර සැලසුම්කරණය හා වාහන මගී ආසන නිෂ්පාදනය පිළිබඳ මනා (ප්‍රමාණවත්) පළපුරුද්ද සහිත පිළිගත් සමාගම් වෙතින්, මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ආපසු ගෙවනු නොලබන රු. 2,500.00ක පමණක් ගාස්තුවක් ගෙවීමෙන් 2013.09.17 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන්, ලබාගත හැකි ආකෘතිපත්‍ර මත පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

03. ලංසු, එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම 2013.09.18 වැනි දින ප. ව. 2.00 ට කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සාමාන්‍යාධිකාරි කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට පැමිණ සිටින ලෙස, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ආරාධනය කරනු ලැබේ.

04. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ හැකිය :-

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

05. ලංසු ලිපිලේඛන, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි වන අතර, වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා කරුණාකර විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත, කොළඹ 10.
දුරකථන අංක : 2432044 හෝ 2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

08-1070

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ අනුරාධපුර දුම්රිය ස්ථානයේ 01 වන වේදිකාවේ පිහිටි ස්ථාවර භෝජනාගාරය බදුදීම සඳහා ප්‍රසම්පාදන ලංසු කැඳවීමයි**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර 01 වේදිකා භෝජනාගාරය වසර දෙකක කාලයකට ආහාර පාන අලෙවි කිරීමේ සේවාවන් පවත්වාගෙන යාම සඳහා පිළිගත් භෝජනාගාර හා හෝටල් හිමියන්ගෙන් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසු කැඳවනු ලැබේ.

02. ඊට අදාළ ලංසු ඉදිරිපත් කිරීමට කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන ගණකාධිකාරි වෙත ආපසු නොගෙවන ප්‍රසම්පාදන ලංසු පෝරම ගාස්තුව වන රු. 2,500 ක් ගෙවා ලබාගත් කුවිතාන්සිය දුම්රිය ගබඩා අධිකාරි වෙත ඉදිරිපත් කර ලබාගන්නා ලද පෝරමයේ පමණක් මෙම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. ආපසු ගෙවන ලංසු බැඳුම්කරයක් ලෙස රු. 10,000 ක මුදලක් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි වෙත ගෙවා ලබා ගන්නා ලදුපත ලංසු අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

03. ඉහත සඳහන් පෝර්ම සහ ඊට අදාල ලියවිලි 2013.09.04 වැනි දින ප. ව. 3.00 දක්වා දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් නිකුත් කරනු ලැබේ.

04. නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද අයදුම්පත් 2013.09.05 වැනි දින ප. ව. 2.00 ට පෙර "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථානයේ ලංසුපත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ පෙට්ටියෙහි බහාලීමට කටයුතු කළ යුතු ය.

05. එදින ප. ව. 2.00 ට අයදුම්පත් භාරගැනීම අවසන් වූ වහාම එම ස්ථානයේ දී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවේ දී අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ.

06. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සියලු සේවකයන්ට හා ඔවුන්ගේ පවුල්වල ආසන්නම සාමාජිකයන්ට අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා හිමිකමක් නැත.

07. අවශ්‍ය වැඩි විස්තර සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ගබඩා අධිකාරි කාර්යාලය වෙතින් විමසන්න. දුරකථන අංක 011-2438078 /011- 2436818.

08. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරි.

2013 අගෝස්තු මස 02 වැනි දින,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

08-1068

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

මිලදීගැනීමේ නිවේදනය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා දුම්රිය පීලි අතර පුරවන කුඩාගල් කියුබ් 4,100 ක් (4,100 cubes of track ballast) සැපයීම සඳහා මිල ගණන් කැඳවීම**

පහත සඳහන් ස්ථානයන් සඳහා දුම්රිය පීලි අතර පුරවන කුඩා ගල් සැපයීම සඳහා මුද්‍රා තබන ලද ලංසු 2013.09.10 වැනි දින ප. ව. 2.00 දක්වා කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (ප්‍රධාන) විසින් භාරගනු ලබයි. පහත සඳහන් එක් එක් අයිතමය සඳහා මෙම ලංසු ඇගයීම්කර ප්‍රදානය සිදු කරනු ඇත.

| අයිතම | ස්ථානය | කියුබ් | භාරදිය යුතු කාලසීමාව |
|---|---|---|---|
| 01. | මරදාන කැලණිවැලි බඩුගබඩාව | 1,000 | මාස 06 |
| 02. | මොරටුව - ලුනාව | 600 | මාස 03 |
| 03. | වාද්දූව අංගනය | 1,000 | මාස 06 |
| 04. | අංක 01 දුම්රිය නැවතුම්පොල | 1,000 | මාස 06 |
| 05. | කොස්ගම අවිස්සාවේල්ල | 500 | මාස 04 |

02. රු. 3,000 ක අපසු ගෙවන නොලබන ලේඛන ගාස්තුවක් ගෙවීමෙන් 2013.09.09 දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

03. 2013.09.10 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වෙයි.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය මූලස්ථානයේ දී ලංසු විවෘත කිරීම සිදු කරනු ලැබේ. ලංසු තබන්නන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණෙන ලෙස ආරාධනය කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සේවා මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම ගාස්තු ගෙවීමකින් තොරව කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී සිදු කළ හැකි අතර වැඩිදුර විස්තර අංක 2438078 හෝ 2436818 දරන දුරකථන මගින් දුම්රිය ගබඩා අධිකාරී වෙතින් විමසන්න. ෆැක්ස් අංකය 2432044.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : එස්ආර්එස්/එෆ්/7046.

08-1069

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වරකාපොල**

අධිකරණයට ඉදිරිපත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වරකාපොල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාල රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2013.09.28 වැනි දින පෙ. ව. 10.00 ට වරකාපොල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය. වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

සනත් ජේ. මොරවක,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
වරකාපොල.

වර්ෂ 2013ක් වූ අගෝස්තු මස 06 වැනි දින,
වරකාපොල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

උපලේඛනය - 2013 භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 55483 | GPSC 9313 දරන ට්‍රේලරය සහිත අත්ට්‍රැක්ටරය | 01 |
| 02. | 70642 | ෆාම් මාස්ටර් වර්ගයේ අංක OCO 209 දරන අත්ට්‍රැක්ටරය | 01 |
| 03. | 67799 | අංක රහිත ජීඇන් වර්ගයේ අත්ට්‍රැක්ටරය | 01 |
| 04. | 50595 | අංක 112-9441 CD 90 වර්ගයේ හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය | 01 |
| 05. | ඒ. 701/09 | අංක 129-4579 YP 90 යමහා වර්ගයේ යතුරුපැදිය | 01 |
| 06. | ඒ 822/09 | අංක 132 7392 GT 20 හොණ්ඩා වර්ගයේ යතුරු පැදිය | 01 |
| 07. | ඒ 436/10 | අංක NW GL 4651 වර්ගය අපැහැදිලි යතුරුපැදිය | 01 |
| 08. | 21948 | පාපැදි | 01 |
| 09. | 25299 | පාපැදි | 01 |
| 10. | 61988 | පාපැදි | 01 |
| 11. | 58725(බී 24610) | පාපැදි | 01 |
| 12. | 34700 | පාපැදි | 01 |
| 13. | ඒ 800/09 | පාපැදි | 01 |
| 14. | ඒ 5306 | පාපැදි | 01 |
| 15. | ඒ 324/10 | පාපැදි | 01 |
| 16. | ඒ 746/10 | පාපැදි | 01 |
| 17. | ඒ 325/10 | පාපැදි | 01 |
| 18. | ඒ 469/10 | පාපැදි | 01 |
| 19. | ඒ 5302 | පාපැදි | 01 |
| 20. | ඒ 2127 | පාපැදි | 01 |
| 21. | ඒ 4420 | පාපැදි | 01 |
| 22. | ඒ 441/09 | පාපැදි | 05 |
| 23. | ඒ 5307 | පාපැදි | 01 |
| 24. | 39122 | 1. ගෑස් සිලින්ඩරය | 01 |
| | | 2. රෙගියුලේටරය | 01 |
| | | 3. ගෑස් ලිප් | 01 |
| 25. | 38496 | 1. ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01 |
| | | 2. ගෑස් ලිප් (01) | 01 |
| | | 3. යකඩ බැරල් | 01 |
| 26. | 45496 | 1. ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01 |
| | | 2. ගෑස් උඳුන් | 01 |
| | | 3. හිස් යකඩ බැරල් | 01 |
| 27. | 58930 | 1. ගෑස් සිලින්ඩරය | 01 |
| | | 2. රෙගියුලේටර් සහිත රවුම් ගෑස් ලිප් | 01 |
| 28. | ඒ 892/10 | ෂෙල් වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01 |
| 29. | 73677 | 1. ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01 |
| | | 2. රෙගියුලේටර් | 01 |
| | | 3. ගෑස් ලිප් | 01 |
| | | 4. යකඩ බැරල් | 01 |
| 30. | 66679 (බී 776/10) | 1. ෂෙල් ගෑස් සිලින්ඩරය | 01 |
| | | 2. රෙගියුලේටර් | 01 |
| | | 3. හීටර් සවිකරන ලද බැරල් | 01 |
| | | 4. ඇම්පියර් 15 ප්‍රමාණයේ ප්ලග් 02ක් සවිකළ කළු පැහැති වයර් | |
| 31. | 73923 | 1. ගෑස් සිලින්ඩරය | 01 |
| | | 2. ගෑස් ලිප් | 01 |
| | | 3. මධ්‍යම ප්‍රමාණයේ ඇළුමිනියම් මුට්ටි | 01 |
| | | 4. මධ්‍යම ප්‍රමාණයේ සිදුරු කළ ඇලුමිනියම් මුට්ටි | 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 32. | 63983 | 1. ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01 |
| | | 2. ගෑස් ලිප් | 01 |
| | | 3. යකඩ බැරල් | 08 |
| 33. | 74864 | 1. ලාෆ් ගෑස් සිලින්ඩරය | 01 |
| | | 2. රෙගියුලේටර් | 01 |
| | | 3. ගෑස් ලිප් | 01 |
| | | 4. යකඩ බැරල් | 03 |
| 34. | 49298 (බී 477/08) | 1. විදුලි මෝටර් | 01 |
| | | 2. කටර් අඬු | 01 |
| | | 3. කලු වයර් | 01 |
| 35. | 44153 | ඇළුමිනියම් මුට්ටි | 01 |
| 36. | 47182 | ඇළුමිනියම් මුට්ටි | 01 |
| 37. | 52984 | ඇළුමිනියම් මුට්ටි | 01 |
| 38. | 70748 | 1. අලුමිනියම් මුට්ටි | 01 |
| | | 2. යකඩ බැරල් | 01 |
| 39. | 69922 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 40. | 72011 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 41. | 72248 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 42. | 72542 | 1. ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | 2. සිදුරුකළ ඇලුමිනියම් කොරොස් | 01 |
| 43. | 66548 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 44. | 58143 | 1. ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | 2. පරණ ප්ලාස්ටික් බේසම් | 01 |
| 45. | 70405 | 1. ඇළුමිනියම් මුට්ටි | 01 |
| | | 2. සිදුරුකළ ඇලුමිනියම් භාජන | 01 |
| 46. | 46707 | 1. ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | 2. එය වැසීමට ගන්නා ලද හිලක් | |
| 47. | 58283 | ඇලුමිනියම් හිල් මුට්ටි | 01 |
| 48. | 38680 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 49. | 75128 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 50. | 61807 | 1. සිදුරක් සහිත ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | 2. ඇළුමිනියම් මුට්ටි | 01 |
| 51. | 58422 (බී547/10) | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 02 |
| 52. | බී 38770 | මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 53. | ඒ 701/10 | ට්‍රයිටෙල් වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 54. | ඒ 448/10 | ජංගම දුරකථන | 01 |
| 55. | 46577 | හිස් යකඩ බැරල් | 01 |
| 56. | 36491 | හිස් යකඩ බැරල් | 02 |
| 57. | 38132 | හිස් යකඩ බැරල් | 03 |
| 58. | 65444 | හිස් යකඩ බැරල් | 01 |
| 59. | 37102 | නිල්පාට ප්ලාස්ටික් බැරල් | 03 |
| 60. | 37153 | කළුපාට පියන් සහිත ප්ලාස්ටික් භාජන | 01 |
| 61. | 74341 | නිල්පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| | | සහිත යකඩ පියන් | 01 |
| 62. | 69651 | ඇලුමිනියම් කළ | 01 |
| 63. | 61677 | 1. ඇලුමිනියම් කළ | 01 |
| | | 2. යකඩ බැරල් | 02 |
| | | 3. බටරෝල් | 02 |
| 64. | 67389 | ඇලුමිනියම් කළයේ උඩකොටස සහිත කල භාග | 01 |
| 65. | 34062 | 1. දිග අඩි 05 අඟල් 11 පළල අඟල් 35 වූ දොරපලු | 01 |
| | | 2. දිග අඩි 05 අඟල් 09 පළල අඟල් 18 වූ දොරපලු | 01 |

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 66. | 29649 | 1. | පැදුරු | 06 |
| | | 2. | පී. වී. සී. බට | 04 |
| 67. | 50973 | | වීල්බැරෝ | 01 |
| 68. | 53463 | | වීල්බැරෝ | 01 |
| 69. | ඒ 792/10 | | වීල්බැරෝ | 01 |
| 70. | අංක රහිත | | පැදුරු තොගයක් | |
| 71. | අංක රහිත | | ප්ලාස්ටික් බුලි තොගයක් | |
| 72. | අංක රහිත | | හිස් වීදුරු බෝතල් තොගයක් | |
| 73. | අංක රහිත | | හිස් යකඩ බැරල් තොගයක් | |
| 74. | අංක රහිත | | වේවැල් කුඩ තොගයක් | |
| 75. | අංක රහිත | | යකඩ තොගයක් | |
| 76. | | | හල්ඩා වර්ගයේ සිංහල යතුරු ලියනය | 01 |
| 77. | | | කැෂියෝ වර්ගයේ කැල්කියුලේටර් | 01 |
| 78. | | | සිටිසන් වර්ගයේ කැල්කියුලේටර් | 02 |
| 79. | | | ෆිල්ටර් ස්ථාමය | 01 |
| 80. | | | සාමාන්‍ය පුටු (කුඩා) | 05 |
| 81. | | | ඇඳි සහිත පුටු | 05 |
| 82. | | | නීතිඥ යකඩ පුටු | 01 |
| 83. | | | ස්ටේප්ලර් | 03 |
| 84. | | | හම්බෑග් | 03 |
| 85. | | | මේසන් හැඳි | 02 |
| 86. | | | විදුලි පන්දම | 01 |
| 87. | | | බිත්ති ඔරලෝසු | 03 |
| 88. | | | බිත්ති ඔරලෝසු (ටෙලිසොනික්) | 01 |
| 89. | | | බංකු (ඇඳි සහිත) | 02 |
| 90. | | | වානේ කැබිනට් (ලිපිගොනු) | 01 |
| 91. | | | ඡායා පිටපත් යන්ත්‍ර (නොකියා 3231) | 01 |
| 92. | | | පරිඝනක මුද්‍රණ යන්ත්‍ර | 01. |

08-935

---

**මහාධිකරණය - යාපනය**

පොදු වෙන්දේසිය

යාපනය මහාධිකරණ භූමියෙහි තිබෙන අයිතිවාසිකම් නොපාන ලද මෝටර් වාහනවල පැරණි කොටස් 2013.09.05 වැනි බ්‍රහස්පතින්දා දින පෙ. ව. 10.00 ට යාපනය මහාධිකරණ භූමියෙහි වෙන්දේසි කරනු ලැබේ.

කොන්දේසි :-

01. වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය සහිතව ඉහත කොටස් මහජනතාවට නැරඹීමට හැකියාව ඇත.
02. වෙන්දේසි කරනු ලබන භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන පුද්ගලයන් ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.
03. වෙන්දේසි භාණ්ඩ මිල දී ගැනීමේ දී ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා භාණ්ඩ ලබාගත යුතු අතර ඒවා විකිණීමෙන් පසු අධිකරණ භූමියෙහි තබා ගැනීමට නොහැක. චෙක්පත් භාවිතා කළ නොහැකිය.

ඒ. ප්‍රේමශංකර්,
මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
යාපනය.

2013 අගෝස්තු මස 01 වැනි දින.

08-830

**පැල්මඩුල්ල දිසා අධිකරණය**

හිමිකම් නොපාන නඩු භාණ්ඩ ප්‍රසිද්ධ කිරීම

පැල්මඩුල්ල දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ 44657 නඩුවට අදාළ පහත සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් අයිතිකරුවෙකු සිටීනම්, මෙම දැන්වීම පළ වී මාස හයක් ඇතුළත අධිකරණයට ඉදිරිපත් වී අයිතිවාසිකම් ඉදිරිපත් කර, භාණ්ඩ ලබා ගන්නා ලෙසත්, එසේ නොවන්නේ නම් අ. න. වි. සං. 432 වගන්ති යටතේ ක්‍රියා කරනු ලබන බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආදළ භාණ්ඩ. බර ග්‍රෑ. 05.9 රන් දම්වැලක් හා ග්‍රෑ. 01.00 බර රන් පෙන්ඩනයක්.

දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,
පැල්මඩුල්ල.

2013 අගෝස්තු මස 13 වැනි දින,
පැල්මඩුල්ල දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

08-937

---

**දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණය**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද, රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද සහ කල් තබා ගැනීමේ දී විනාශ වී යා හැකි භාණ්ඩ 2013.09.14 වැනි දින පෙ. ව. 10.00 සිට එම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම්, වෙන්දේසිය පවත්වන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර, ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර මත වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1 1/2 කට මත්තෙන් නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලීමට මහජනයාට ඉඩ දෙනු ලැබේ.

04. අධිකරණය විසින් ඉදිරිපත් කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි, එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර දැමීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ භාණ්ඩ මිල දී ගන්නා ගැණුම්කරුවන් තම අනන්‍යතාවය සනාථ කිරීමට ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

06. භාණ්ඩ මිල දී ගැනීම ලංකාවේ වලංගු මුදලින් කළ යුතු අතර, ඒ සඳහා අධිකරණය මගින් රිසිට්පතක් නිකුත් කරනු ලැබේ.

07. මිල දී ගන්නා භාණ්ඩ, වෙන්දේසි දින ප. ව. 4.30 ට පෙර වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

චාමර වික්‍රමනායක,
මහෙස්ත්‍රාත්,
දෙහිඅත්තකණ්ඩිය.

2013 අගෝස්තු මස 13 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ |
|---|---|---|
| 01. | 52549 (B 353/07) | සෝලා පැනල් 02යි<br>බැටරි 01 |
| 02. | 4853 | වයර් පාර්සල් 01යි |
| 03. | 5308 | වයර් පාරස්ල් 01යි |
| 04. | 72335 | වයර් පාර්සල් 01යි |
| 05. | බී 647/02 | ශබ්ද විකාශන යන්ත්‍ර කට්ටලය |
| 06. | 66934 | පොරොව 01යි |
| 07. | 38405<br>බී 09/05 | වප් පිහි 01යි |
| 08. | 1890<br>බී 46/12 | පිහි 01යි |
| 09. | 1556 | පිහි 01යි |
| 10. | 4011<br>බී 412/12 | පිහි 01යි |
| 11. | බී 863/04 | පිහි 01යි |
| 12. | 50204<br>බී 772/06 | පිහි 01යි |
| 13. | 19854 | දෑ කැති 01යි |
| 14. | 66023<br>බී 528/08 | කැති 01යි |
| 15. | 45409 | සවල් 02යි |
| 16. | 2806 | සවල් 02යි, ප්ලාස්ටික් බකට් 02යි |
| 17. | 4120<br>බී 568/12 | අලවංගු 01, සවල් 01, බාල්දි 01,<br>උදලු 01යි, ගිර 01යි |
| 18. | 0024<br>බී 125/11 | උදලු 01යි |
| 19. | 3393<br>බී 319/12 | කුලු ගෙඩි 01යි |
| 20. | 73752 | නගුල් 02යි |
| 21. | 73750 | නගුල් 02යි |
| 22. | 60776<br>බී 799/02 | අත් ට්‍රැක්ටර් රෝද 02යි |
| 23. | 4666 | ෆයිබර් ඔරු 01යි, කොල්ලෑ 01යි,<br>හබල් පිති 02යි |
| 24. | 5267 | ඔරු 01යි, රුවල් 01යි, හබල් 01යි |
| 25. | 66020 | ෆයිබර් ඔරු 01යි |
| 26. | අංක රහිත | ෆයිබර් ඔරු 01යි |
| 27. | අංක රහිත | ෆයිබර් ඔරු 01යි |
| 28. | අංක රහිත | ෆයිබර් ඔරු 01යි |
| 29. | 64306 | දිරා ගිය දරට ගන්නා රීප්ප පටි ගොඩක් |
| 30. | අංක රහිත | යකඩ කැබලි කිහිපයක් |
| 31. | 3600 | කරත්ත 01යි, පොරෝ 03යි |
| 32. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි හා බාල්දි කිහිපයක් |
| 33. | ඒආර් 717/04 | අංක 115-4454 දරන යතුරු පැදිය |
| 34. | 1521 | අංක NC TR - 3027දරන යතුරුපැදිය |
| 35. | 48816 | අංක 108-1356 දරන යතුරු පැදිය |
| 36. | 61191 | අංක 130-6635 දරන යතුරු පැදිය |
| 37. | 0714 | අංක 74-8982 අත් ට්‍රැක්ටරය |
| 38. | 0877 | අංක EP SG 2811 දරන අත් ට්‍රැක්ටරය |
| 39. | 1726 | අංක EP SD 9801 දරන අත් ට්‍රැක්ටරය |
| 40. | 77970 | අංක NC SF 4926 දරන අත් ට්‍රැක්ටරය |
| 41. | 5504 | වැලි කියුබ් 04 |
| 42. | අංක රහිත | ප්‍රමාණය සඳහන් කළ නොහැකි<br>වැලි තොගයක් |
| 43. | අංක රහිත | හිස් බෝතල් ගොඩක් |

**දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් නිල නිවාසයෙන් ඉවත් කරන ලද උළු:**

| අනු. අංකය | |
|---|---|
| 01. | මහෙස්ත්‍රාත් නිල නිවාසයෙන් ඉවත් කරන ලද පැතලි උළු කැට 3346 |
| 02. | මහෙස්ත්‍රාත් නිල නිවාසයෙන් ඉවත් කරන ලද මුදුන් උළු කැට 40 |

08-1084

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - රඹඩගල්ල**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද, රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. රඹඩගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවලට අදාළව අධිකරණයට ඉදිරිපත් කරන ලද රාජසන්තක හා මෙතෙක් හිමිකම් නොපාන නඩු භාණ්ඩ හා වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව ඉවත් කළ හැකි කාර්යාලීය උපකරණ 2013.09.19 වැනි දින පෙ. ව. 9.30 ට රඹඩගල්ල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන අයෙකු වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින පෙ. ව. 9.00 ට පෙර ස්වකීය හිමිකම් සනාථ කිරීමේ ලියවිල්ලක් මගින් මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට පෙර සිට වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව පිළිනොගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා ඒවා අධිකරණ භූමියෙන් එදින ප. ව. 4.00 ට පෙර ඉවත්

කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක් සිදු කළ යුතු ය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. ගැණුම්කරුවන් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි පැහැදිලි හැඳුනුම්පතක් අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතු ය.

07. වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසවක් වේ නම්, එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණය වෙත දැනුම් දිය යුතු අතර, පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

08. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳ සියලු කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව මෙයින් දන්වා සිටිමි.

ඩී. එම්. ඩී. සී. බණ්ඩාර,
මහෙස්ත්‍රාත්, රඹඩගල්ල.

2013 අගෝස්තු මස 12 වැනි දින,
රඹඩගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව - 2013**

| අනු. අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 01. | 6716 (බී/445/09) | | පිහිය |
| 02. | 4211 | | පිහිය |
| 03. | 11285 | 1. | එක් පැත්තක් උල් වූ අනෙක් පැත්ත පැතලි යකඩ ඉනි 02 |
| | | 2. | පැතලි ලී මිට සහිත යවුල් 01 |
| | | 3. | 9 x 7 රජින වර්ගයේ ලී මිට සහිත උදැල්ල |
| | | 4. | 9 x 9 කිඹුලා වර්ගයේ ලී මිට සහිත උදැල්ල |
| | | 5. | නිල් පාට ලන්තෑරුම් 01 |
| 04. | 58469 | | පිහි 02ක් |
| 05. | 10005 | | නිල්පාට ටෙන්ට් රෙද්දක් |
| 06. | 9908 | | පිහිය |
| 07. | 2984 | | පිහිය |
| 08. | 8466 (බී/170/11) | | පිහිය |
| 09. | 8468 | | පිහිය |
| 10. | 10989 | 1. | නිකල් පිහිය 01 |
| | | 2. | යකඩ පිහිය 01 |
| | | 3. | යකඩ අත් පොරවක් |
| 11. | 9825 | 1. | නියනක් |
| | | 2. | පීරක් |
| | | 3. | අත් ග්ලවුස් 02ක් |
| 12. | 4632 | | ඇල්ලිස් කටුව |
| 13. | 12465 | | සවලක් |
| 14. | 11950 | 1. | අලවංගු 02 |
| | | 2. | උදලු 02 |
| | | 3. | අඩි 32යි, අගල් 07 ක් දිග නිල් සහ කොළ පාට තංගුස් කඹ 01 |
| | | 4. | මල් වැලක් සහිත හා මල් වැල් රහිත වීදුරු 02 |
| | | 5. | මල් වැල් සහිත කුඩා පිඟන් 02 |
| | | 6. | කලු පාට රබර් සෙරෙප්පු ජෝඩු 01 |
| | | 7. | ජී. ෂයිව් වර්ගයේ ජංගම දුරකථනය |
| | | 8. | කලු පාට මුදල් පසුම්බිය |
| 15. | 12477 | 1. | යකඩ ඉනි 01 |
| | | 2. | කොළය සහිත යකඩ ඉනි 01 |
| | | 3. | 9 x 9 වර්ගයේ උදලු 01 |
| | | 4. | 8 x 10 වර්ගයේ උදලු 01 |
| 16. | 12158 | | FL 5200 දරන යාන්ත්‍රික කියත |
| 17. | 12187 | | සවලක් |
| 18. | 10753 | | කුඩා බූලියක් |
| 19. | 13005 | | GT-E 1085 සැම්සුන් වර්ගයේ ජංගම දුරකථනය |
| 20. | 11193 | | ලී - ෆෝන් වර්ගයේ ජංගම දුරකථනය |
| 21. | 11301 | | පිහිය |
| 22. | 529 | | යකඩ අලවංගුව |
| 23. | 2065 | | පිහිය |
| 24. | 12187, 13606, 13026, 13674, 12465, 13027, 10423, 13851 | 14712, 14728, 14525, 14791, 13581, 14536 | වැලි කියුබ් 10ක් |
| 25. | 10351 | 1. | ඔස්කා වර්ගයේ අත් ඔරලෝසු 1 |
| | | 2. | ඉමිටේෂන් වලලු 02 |
| | | 3. | ඉමිටේෂන් ගල් අල්ලන ලද රතුපාට හවඩි 01 |
| 26. | 12265 | 1. | යකඩ කුරුපිහිය |
| | | 2. | පිහිය 01 |
| | | 3. | විදුලි පන්දම |
| | | 4. | ප්ලාස්ටික් බූලිය |
| | | 5. | ඇලුමිනියම් ලොකු මුට්ටිය |
| | | 6. | ඇලුමිනියම් කොරසයක් |
| 27. | අංක රහිත | | දිරාපත් වූ දැව තොගයක් |
| 28. | බී/672/06 | 1. | දිග අඟල් 57 පළල අඟල් 19 ජනෙල් ග්‍රිල් 04ක් |
| | | 2. | දිග අඟල් 18 පළල අඟල් 123 1/2 ජනෙල් ග්‍රිල් 04ක් |
| 29. | 14324 | | නිල්පාට ප්ලාස්ටික් කෑන් 02 |
| 30. | 14321 | | කුඩා ප්‍රමාණයේ සුදු පාට කෑන් 01 |
| 31. | 1511 | | පිහිය |
| 32. | 12774 | 1. | ලීටර් 40 ධාරිතාවයකින් යුතු කෑනය |
| | | 2. | කෑන් 01 |
| 33. | 14513 | | ඇලුමිනියම් මුට්ටිය |
| 34. | ඒආර් 102/13 | | අංක CE 0434 දරන නොකියා වර්ගයේ ජංගම දුරකථනය |
| 35. | 14440 | | බූලියක් |
| 36. | 14448 | | බූලියක් |
| 37. | 14509 | | මිලි. ලී. 33,750 ධාරිතාවයෙන් යුතු කෑනය |
| 38. | 14232 | | ප්ලාස්ටික් බැරලය |
| 39. | 11764 | | මිලි. ලී. 21,750 ධාරිතාවයෙන් යුතු කෑනය |
| 40. | 12905 | | මිලි. ලී. 32,250 ධාරිතාවයෙන් යුතු කෑනය |
| 41. | 13541 | | මිලි. ලී. 25,500 ධාරිතාවෙයන් යුතු කෑන් 02 |
| 42. | 14812 | 1. | බැරලය |
| | | 2. | කෑන් 02 |
| 43. | 14809 | 1. | ප්ලාස්ටික් බේසම් 01 |
| | | 2. | අඩි 20ක් දිගැති ප්ලාස්ටික් බටය |
| 44. | 11764 | | ප්ලාස්ටික් කෑනය |
| 45. | 13581 | | සවල |
| 46. | ඒආර් 138/13 | 1. | වේවැල් කුඩ 02 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| | | 2. යකඩ බාල්දි 01 |
| | | 3. සවල |
| 47. | 11532 | කුඩා පාපැදිය |
| 48. | බී/303/07 | පා පැදිය |
| 49. | 59142 | කාන්තා පා පැදිය |
| 50. | 8439 | ඩිස්කවරි වර්ගයේ යතුරු පැදිය |
| 51. | ඒආර් 114/10 | හොණ්ඩ වර්ගයේ යතුරුපැදිය |
| 52. | 12158 | සී ෆැන් වර්ගයේ අබලන් අත් ට්‍රැක්ටරය |
| 53. | 12184 | සී ෆැන් වර්ගයේ අබලන් අත් ට්‍රැක්ටරය |
| 54. | 11441 | සී ෆැන් වර්ගයේ අබලන් අත් ට්‍රැක්ටරය |
| 55. | 6375 | සී ෆැන් වර්ගයේ අබලන් අත් ට්‍රැක්ටරය |
| 56. | 12264 | සී ෆැන් වර්ගයේ අබලන් අත් ට්‍රැක්ටරය |
| 57. | 12229 | සී ෆැන් වර්ගයේ අබලන් අත් ට්‍රැක්ටරය |
| 58. | - | වීදුරු බෝතල් 500ක් පමණ |
| 59. | සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව | 1. ලී අල්මාරි 01 |
| | | 2. ලී කැබිනට් 01 |
| | | 3. බංකු-ඇඳි සහිත (දිග) 02 |
| | | 4. සාමාන්‍ය මේස 01 |
| | | 5. ඇඳි රහිත පුටු 05 |
| | | 6. ඇඳි සහිත පුටු 06 |

08-1080

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2014 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් 31 වැනි දින දක්වා රා තැබෑරුම් රේන්ද විකිණීම

2014 ජනවාරි 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් බාර ගනු ලැබේ.

01. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරය සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

02. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එකී කවරයේ වම් කෙළවරෙහි 'අංක .................. දරන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය' යනුවෙන් සඳහන් කොට 2013.09.20 වැනි දින පෙ. ව. 10.30ට පෙර වත්තල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

03. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

04. 2013.09.20 වැනි දින පෙරවරු 10.30ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. පූර්වාසන්න දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම 2013.11.15 වැනි දින පෙරවරු 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

06. මේ සම්බන්ධ වැඩි විස්තර වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

චන්දිමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2013 අගෝස්තු මස 05 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| කොට්ඨාසය | ග්‍රාමය | ටෙන්ඩර්පත් බාර ගන්නා අවසාන දිනය හා වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|
| වත්තල | අංක 01-තිඹිරිගස්යාය | 2013.09.20 පෙ. ව. 10.30 | 7,260 0 |
| වත්තල | අංක 02-උස්වැටකෙයියාව | එම | 4,840 0 |
| වත්තල | අංක 07-බෝපිටිය | එම | 7,260 0 |
| වත්තල | අංක 08-මහවත්ත | එම | 6,050 0. |

08-936

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) ඡේදය

සමාගමේ නම : ෂපූර්ජි පලොන්ජි ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 92649 .
ලියාපදිංචි කාර්යාලය : 3 වන මහල, අංක 345, ගාලු පාර, කොළඹ 02

සමාගමේ නම : ආර්ක් ටෙක්නොලොජිස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 93860
ලියාපදිංචි කාර්යාලය : අංක 78 1/1, හැව්ලොක් පාර, කොළඹ 5.

සමාගමේ නම : කොලීන් කෙන්ට් මැනේජ්මන්ට් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 94053
ලියාපදිංචි කාර්යාලය : ද මොනාර්ක් Apt 21/B 6, අංක 89, ගාලු පාර, කොළඹ 3.

08-1056

## දැන්වීමයි

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) ඡේදය**

සමාගමේ නම : සාගා අයිලන්ඩ් වොයේජස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91734
ලියාපදිංචි කාර්යාලය : අංක 26/8ඒ, යහම්පත් උද්‍යානය, යහම්පත් මාවත, මහරගම.

08-1057

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (2) වගන්තිය ප්‍රකාරව

සමාගමේ පෙර නාමය : ඩිසයින් ගාමන්ට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 19312
ලියාපදිංචි ලිපිනය : අංක 5/7, චාර්ල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව
සමාගමේ නව නාමය : එස්. එස්. ඔටෝ (පීවීටී) එල්ටීඩී.

08-1058

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කුරුණෑගල, මීගමු පාර, ගල්වල පාර, අංක 2/12 හි පදිංචිව සිටින දැනට ජපානයේ පදිංචි මොහමඩ් ඉස්මත් මොහොමඩ් ඉයුෂාන් (ජා හැ. අංක 700922065 X) වන මා විසින් 2007.07.03 වැනි දින ටී. එස්. අයි. වැත්තෑව ප්‍රසිද්ධ නොතාරිස් සහතික කළ අංක 4143 දරන ඇටර්නි බලපත්‍රය මගින් කුරුණෑගල තැපැල්, මීගමු පාර, ගල්වල පාර, අංක 2/12 පදිංචි ජුනෙයිඩින් ජාරියා උම්මා වෙත පවරනු ලැබූ සියලුම බලතල අවලංගු කර මින් ඉදිරියට ඇය විසින් මෙම ඇටර්නි බලපත්‍රය මත කරනු ලබන සියලුම කටයුතු බලශූන්‍ය සහ බලරහිත බව දන්වමි.

MOHAMED ISMATH MOHAMED IHUZAN.

08-1059

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කොච්චිකඩේ, නැගෙනහිර පළඟතුරේ, අංක 41/1 හි පදිංචිව සිට දැනට මීගමුව ඒත්තුකාල, රානි මාවත, අංක 60/ඒ හි පදිංචි ඕවිටිගල විතානගේ ශ්‍රියානි ධම්මිකා වන මම ගිලීෂියන් ප්‍රනාන්දුපුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2006 අගෝස්තු මස 10 වැනි දින සහතික කළ අංක 8457 දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් කොච්චිකඩේ, නැගෙනහිර පළඟතුරේ, අංක 41/1 හි පදිංචි ලංකාහලුගේ සනත් කුමාර් ප්‍රනාන්දු හට දෙන ලද ඇටර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ඕවිටිගල විතානගේ ශ්‍රියානි ධම්මිකා.

08-1063

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

ප්‍රංශය, අයුබර්විල්ලර්ස්, 93300, ඇලි අපෝන්ස් ජොයිස් අංක 21 දරන ස්ථානයේ පදිංචි (ශ්‍රී ලංකාව තුළ අංක 11, ජෝසප් පටුමග, කටුකුරුන්ද, මොරටුව) දළුවතුමුණි වලව්වගේ ෂෙරින් ශ්‍යාමලී ප්‍රනාන්දු (ජා. හැ. අංක

605740332 V) සහ මහබදුගේ සැන්ඩ්‍රින් ප්‍රනාන්දු වන අපගේ නමින් ලියාපදිංචි වී ඇති 2013 මාර්තු මස 7 වැනි දින ආර්. ජුඩ් රත්වත් විසින් සහතික කළ ශ්‍රී ලංකාවේ ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ 2013.04.05 වැනි දින ලියාපදිංචි කළ විදේශ ඇටර්නි බලපත්‍රය මගින් ගල්කිස්ස, ගාලු පාර, අංක 429/5ඒ දරන ස්ථානයේ පදිංචි ගන්ගොඩවිලගේ ඉනෝකා ප්‍රියදර්ශනී පෙරේරා (ජා. හැ. අංක 738231384 V) යන අයට ඇටෝර්නි බලය පවරා ඇත.

එකී ඇටෝර්නි බලපත්‍රයේ දෙවන ඇටෝර්නි අධිපතිගේ අත්සන නියමිත ස්ථානයේ යොදා නැති දෝෂය මත අවලංගු කළ බව පොදු මහජනයාට මෙයින් දැනුම් දෙමු.

දළුවතුමුණි වලව්වගේ ෂෙරීන් ශ්‍යාමලී ප්‍රනාන්දු,
මහබදුගේ සැන්ඩ්‍රින් ප්‍රනාන්දු.

08-1064

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

නින්දාන නාගහගොඩ අංක 102 හි පදිංචි ගොඩේගේ චමින්ද ප්‍රේම් කුමාර් (ජා. හැ. පත් අංක 740110497 V) වන මට රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ 39 කාණ්ඩය 84 පත් ඉරුව පොත් අංක 2896 හා වර්ෂ 2013.12.03 වැනි දින ලියාපදිංචි කරන ලද වර්ෂ 2012.11.01 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. එස්. සිල්වා මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1322 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් ශ්‍රී ලංකාවේ බටපොල අලුත්වත්ත හි පදිංචි වඩුතන්ත්‍රිගේ මංගල පුෂ්ප කුමාර (672210640 V) වෙත පවරනු ලැබූ ඉහත කී ඇටර්නි බලය මෙයින් අවලංගු කොට නිෂ්ප්‍රභා කරන බවත් මෙහි සඳහන් දිනයට පසුව එළඹෙන දිනයක මා වෙනුවෙන් ඉහත සඳහන් ඇටර්නි බලලාභි මෙම කරුණට අදාළව කරන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් වගකීමට ම බැඳී නොසිටින බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොදු ජනතාවට මෙයින් දන්වා සිටිමි.

ගොඩේගේ චමින්ද ප්‍රේම් කුමාර්.

2013 අගෝස්තු මස 14 වැනි දින.

08-1086

---

## දැන්වීමයි

පසල්කා ට්රේඩින්ග් පුද්ගලික සමාගම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : සල්කා ට්රේඩින්ග් පුද්ගලික සමගම
සංස්ථාපිත අංකය : පී වී 61772, ඔක්තෝබර් මස 22, 2007
ලියාපදිංචි ලිපිනය : අංක 1100/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල යටතේ ලියාපදිංචි කළ බව දන්වනු ලැබේ.

නීතිඥ පරාක්‍රම ද අල්විස්,
සමාගම් ලේකම්.

08-1020

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : අමාවී හොස්පිටල් (පී. වී. ටී.) එන්. ටී. ඞී.
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 77570
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 75 ඒ, හයිලෙවල් පාර, කිරුලපන, කොළඹ 06
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.12.04.

08-1002/3

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : කළම්බු ඉන්ටීරියස් (ප්‍රයිවට්) ලිමිටඞ්
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 91746
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 1/10, ගල්හේන පාර, ගන්ගොඩවිල, නුගේගොඩ
සමාගම ලියාපදිංචි කළ දිනය : 2013.03.27

08-1002/2

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : බූමි ලංකා කොක්‍රෝ ප්‍රොඩක්ට්ස් (පී. වී. ටී.) එල්. ටී. ඞී.
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 91785
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : ඉහළ කොස්වත්ත, තරන, උඩවෙල
සමාගම ලියාපදිංචි කළ දිනය : 2013.03.28

08-1002/1

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව පහත සමාගම 2013 අගෝස්තු මස 05 වැනි දින සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : හෝම්ස්ටෙඩ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඞ්
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 93927
ලියාපදිංචි කාර්යාලය : අංක 39/4, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 08.

ජේසී ඇන්ඩ් කම්පණී,
සමාගම් ලේකම්වරු.

අංක 9/5 තම්බයියා ඇවනිව්,
කොළඹ 07.

08-943

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාකොළ, සපුගස්කන්ද, සමෘද්ධි මාවත අංක 57 සී දරන ස්ථානයේ පදිංචි (දැනට No. 7 Renee Avenue, Endeavour Hills, 3802 Melbourne, Australia) මාපලගම ලියනගේ දොන් සෙබස්තියන් ඩයන් රෝයි ද සිල්වා වන මම ප්‍රසිද්ධ නොතාරිස් ශාන්ති රේණුකා මරියා සිල්වා මහත්මිය විසින් 2010ක් වූ ජුනි මස 1 වැනි දින ලියා සකස් කරන ලද අංක 64 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මාපලගම ලියනගේ ෆිලෝමිනා ඇනිස්ටින් රෝහිනි පෙරේරා (විවාහයට පෙර ද සිල්වා) ජාතික හැඳුනුම්පත් අංක 495131750 V යන අය වෙත පවරන ලද සියලුම බලතල හා වගකීම් අද දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරන අතර,

මෙයින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය මත ඉහත කී මාපලගම ලියනගේ ෆිලෝමිනා ඇනිස්ටින් රෝහිනි පෙරේරා යන අප විසින් කරනු ලබන සියලුම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මා විසින් කිසියම් හෝ වගකීමක් දැරීමට බැඳී නොමැති බවත් මෙමගින් ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටම දැනුම් දෙමි.

එම්. එල්. ඩී.එස්. ඩී. ආර්. ද සිල්වා.

08-951

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

බලපිටිය, වඳදුව, "ෂම්මි" හි පදිංචි දැනට ඉතාලියේ, මිලානෝ නුවර පදිංචිව සිටින තොම්මාදුර ෂාම් මැන්දිස් වන මම ශ්‍රී ලංකා රජයටත්, පොදු ජනතාවටත්, අනෙකුත් සියලු දෙනාටත් දැනුම් දෙන වග නම්, මා විසින් වර්ෂ 2009ක් වූ අගෝස්තු මස 27 වැනි දින ශාන්ත ශ්‍රී කුමාර කවිරත්න, ගාල්ල අධිකරණ කලාපයේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද, අංක 1890 දරන ඇටර්නි බලපත්‍රය මගින් බලපිටිය, වඳදුව "ෂම්මි" හි පදිංචි වෛද්‍යසේකර සමන්තිකා හෙවත් විතාන වෛද්‍යසේකර සමන්තිකා යන අයට දෙන ලද ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරමි. මින්පසු ඉහත සඳහන් ඇටර්නි බලපත්‍රය මගින් කරන කිසිදු ගනුදෙනුවක් සම්බන්ධව මම වගකීම භාර නොගන්නා බව මෙයින් දන්වා සිටිමි.

තොම්මාදුර ෂාම් මැන්දිස්.

08-948

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් 9 (1) වැනි ජේදයට අනුව 2013.01.09 වැනි දින චන්ද්‍රිකා ට්‍රේඩර්ස් පුද්ගලික සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දන්වමු.

සමාගමේ නම : චන්ද්‍රිකා ට්‍රේඩර්ස් පුද්ගලික සමාගම
Chandrika Traders (Pvt) Ltd
සමාගමේ අංකය : පී වී 90454
ලියාපදිංචි ලිපිනය : අංක 219, වේල්ල වීදිය, කොළඹ 12

ඇස්. ලෝකනාතන්,
ලේකම්.

අංක 2 සී හිල්ඩා පටුමග,
දෙහිවල.

08-1041

## නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ බ්ලිස් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2013 ක් වූ අප්‍රේල් මස 03 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : බ්ලිස් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91889
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 78, රොස්මීඩ් පෙදෙස,
කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව

කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

08-1037/1

---

## නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ ජී එල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2013 ක් වූ මාර්තු මස 21 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ජී එල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91639
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 40, ඇල්ෆ්‍රඩ් පෙදෙස,
කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

08-1037/2

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ ලන්ඩන් කොස්මෙටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2013 ක් වූ අප්‍රේල් මස 02 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ලන්ඩන් කොස්මෙටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91842
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 78, රොස්මීඩ් පෙදෙස,
කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

08-1037/3

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

මිනුවන්ගොඩ, වැගොව්ව ගර්ට්ලන්ඩ් ෆිනෑන්ස් වත්ත, අංක 25 දරන ස්ථානයෙහි පදිංචි නෛයි ෆෙරෝසා හමීට් (ජා. හැ. අංක 625852668 V) වන මම ප්‍රසිද්ධ නොතාරිස් පියදාස හලැල්ල මහතා විසින් ලියා සහතික කළ අංක 1115 දරන 2008.05.30 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් මිනුවන්ගොඩ, වැගොව්ව, ගර්ට්ලන්ඩ් ෆිනෑන්ස් වත්ත, අංක 157/57 දරන ස්ථානයෙහි පදිංචි නෛයි හනීෂා මොහොමඩ් (ජා. හැ. අංක 645450302 V) යන අයට ලබා දී තිබූ ඇටෝර්නි බලය මෙතැන් පටන් අවලංගු කර බල රහිත කරන බවටත් එම දිනයෙන් පසු නෛයි හනීෂා මොහොමඩ් මා වෙනුවෙන් සිදු කරනු ලබන ගනුදෙනු කිසිවක් සම්බන්ධයෙන් මා වගකීම් නොදරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙ මගින් දැනුම් දෙමි.

නෛයි ෆෙරෝසා හමීට්.

08-1035

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : සුරිච් ඉන්ටීරියර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 92615
ලියාපදිංචි කළ දිනය : 2013.05.20
ලියාපදිංචි කාර්යාලය : අංක 246, මීගමුව පාර, නාගොඩ, කඳාන.

සමාගමේ ලේකම්.

08-1048

---

### සීමාසහිත සමාගමක් සංස්ථාගත කිරීමේ මහජන නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙහි පළකරනු ලබන නිවේදනය

1. සමාගමේ නම : සීමාසහිත ග්‍රීන් ස්ටෙප් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංක : පී වි 93144
දිනය : 2013.06.19
සමාගමේ ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 373, හික්ගහවත්ත, වරාගොඩ, කැළණිය

මණ්ඩලයේ අණ පරිදි,

ලේකම්.

08-809

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ දැනුම් දීමයි

සමාගම සංස්ථාපනය කිරීම

සමාගමේ නම : සී බී එල් ග්ලෝබල් ෆුඩ්ස් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී බී 5126
ලියාපදිංචි කාර්යාල ලිපිනය : තැ. පෙ. 3, හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය
සංස්ථාපිත දිනය : 2013.07.29

කෝපරේට් මැනේජ්මන්ට් කන්සල්ටන්ස්
ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

08-805

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාතර, පල්ලිමුල්ල, ළිඳ පාර, අංක 08 හි පදිංචි සෙයියදු මෂූඩ් සහිල් මවුලානා වන මම මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. එම්. ඉල්ලියාස් මහතා විසින් 2010.05.04 වැනි දින ලියා සහතික කරන ලද අංක 1190 දරන ඇටර්නි බලපත්‍රය මගින් ඉහත ලිපිනයෙහි ම පදිංචි රොශානා ඉරුහම් නමැති අය මාගේ සැබෑ සහ නීත්‍යානුකූල ඇටර්නි බලකරු ලෙස පත් කිරීම මෙයින් අවලංගු කොට අහෝසි කරන බවත් ඒ අනුව එකී ඇටර්නි බලපත්‍රය මෙතැන් පටන් බල රහිත ලේඛනයක් බවත් සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

08-807

---

### ග්ලෝබල් ස්පෝර්ට්ස් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

(සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යටත්)
සමාගම් ලියාපදිංචි අංකය : පී වී 67992

අවසන් මහාසභා රැස්වීම සහ සමාගම විසුරුවා හැරීමේ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 331(2) වගන්තිය යටතේ සෑහීමකට පත් වීමෙන් අනතුරුව ගණන් බේරා වසා දැමීමට යටත් සමාගමේ ගිණුම් සහ අනෙකුත් දේ සම්බන්ධයෙන් පවත්වන අවසන් මහා සභා රැස්වීම 2013 ඔක්තෝබර් මස 04 වැනි දින පස්වරු 3.00 ට කොළඹ 04, කාසල් පටුමගේ අංක 02 හි පිහිටි එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් ආයතනයේ රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගම ඈවරකිරීමේ කටයුතු සිදුකළ ආකාරය,
2. සමාගමේ වත්කම් උපලබ්ධි කළ ආකාරය, සහ
3. අදාළ අනෙකුත් විස්තර ලබා දීම සම්බන්ධයෙන්

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්,
ග්ලෝබල් ස්පෝර්ට්ස් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ඒකාබද්ධ ඈවරකරුවන්.

2013 අගෝස්තු මස 09 වැනි දින.

08-839

**මැක් ෂිප්ස් ඒජන්සීස් (කලම්බු) ලිමිටඩ්**

සමාගම් ලියාපදිංචි අංකය : පී බී 1150

**සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දැන්වීම**

2013 ජූලි මස 30 වන දින සමාගමේ පැවති විශේෂ මහා සභා රැස්වීමේ සම්මත වූ විශේෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1)(බී) වගන්තිය යටතේ මෙම සමාගම 2013 ජූලි මස 30 වැනි දින සිට සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

ජේ. ආර්. යූ. ද සිල්වා,
එස්. එස්. ජයවර්ධන,
ඩී. එම්. ජයවර්ධන.
අධ්‍යක්ෂකවරුන්.

2013 අගෝස්තු මස 08 වැනි දින.

08-840/1

---

**මැක් ෂිප්ස් ඒජන්සීස් (කලම්බු) ලිමිටඩ්**

සමාගම් ලියාපදිංචි අංකය : පී බී 1150

2007 අංක 07 දරන සමාගම් පනතේ 346(1) වගන්තිය යටතේ සමාගමේ සංධිය ඈවරකරුවන් පත්කිරීමේ දැන්වීම

කොළඹ 04, කාසල් පටුමගේ අංක 02 හි හතරවැනි මහලෙහි පදිංචි පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ් යන අප 2013 ජූලි මස 30 වැනි දින කොළඹ 04, බෞද්ධාලෝක මාවත, අංක 123 දරන ස්ථානයේ පිහිටි මැක් ෂිප්ස් ඒජන්සීස් (කලම්බු) ලිමිටඩ් හි පැවති විශේෂ මහා සභා රැස්වීමේ සාමාන්‍ය යෝජනා සම්මතයෙන් එම සමාගමේ සංධිය ඈවරකරුවන් වශයෙන් පත්කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්,
සංධිය ඈවරකරුවන්,
මැක් ෂිප්ස් ඒජන්සීස් (කලම්බු) ලිමිටඩ්.

2013 අගෝස්තු මස 08 වැනි දින,
එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත හා ආයතනික අයකර ගැනීම්,
හතර වැනි මහල, අංක 02,
කාසල් පටුමග,
කොළඹ 04.

08-840/2

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

මතුගම, මේධානන්ද මාවතේ, අංක 9 දරන ලිපිනයේ පදිංචි නන්දසිරි පස්කුවල් (ජා. හැ. අ. 391310610 වී) වන මම, මා වෙනුවෙන් හා මා නමින් විශේෂයෙන් සඳහන් කර ඇති කාරණා කටයුතු කීපයක් ඉටුකිරීම සඳහා දොඩන්ගොඩ, සපුගහවත්ත, අංක 406/2බී, ලිපිනයේ පදිංචි තුයියප්පු ආරච්චිගේ දොන් කල්‍යාණ කුමාර ද අල්විස් (ජා. හැ. අ. 661991950 වී) යන අය වෙත ප්‍රදානය කර ඇති මතුගම ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. තිමේෂා ගුණසේකර සිරිවර්ධන මහත්මිය විසින් ලියා සහතික කළ 2011.05.06 දිනැති අංක 1040 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලාංකීය මහජනයා වෙත සහ අදාළ සියලු පාර්ශවයන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

නන්දසිරි පස්කුවල්.

08-841

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : අල් - රුබී ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 72492
ලියාපදිංචි කළ දිනය : 2010.05.31
ලිපිනය : 40, දෙවැනි මහල, මැසෙන්ජර් වීදිය, කොළඹ 12.

සමාගම් ලේකම්වරු.

08-843

---

**2007 අංක 07 සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

සමාගමේ නම : ඉටැලියන් ලංකා ෆිෂ් ඇන්ඩ් ෆුඩ් (පී. වී. ටී.) එල්. ටී. ඩී.
ලියාපදිංචි අංකය : පී වී 92434
ලියාපදිංචි කළ දිනය : 2013 මැයි 09 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 165, රජමහා විහාර පාර, මිරිහාන කෝට්ටේ.

සමාගම් ලේකම්.

08-845

---

**2007 අංක 07 සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

සමාගමේ නම : එස් ඇන්ඩ් ආර්. ඒ. ඇපරල්ස් (පී. වී. ටී.) එල්. ටී. ඩී.
ලියාපදිංචි අංකය : පී වී 76004
ලියාපදිංචි කළ දිනය : 2010 දෙසැම්බර් මස 14 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 128/4, පූර්වාරාම පාර, කිරුළපන, කොළඹ 05.

සමාගම් ලේකම්.

08-847

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

දකුණු ඉන්දියාවේ තමිල්නාඩු දේවකොට්ටයි ARL නිවසේ අංක 5 දරන ස්ථානයේ පදිංචි ව සිට දැනට දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ඊ රෝඩ් 638001 සිනියන් තෝට්ටම්, වේග්ගඩසාමි වීදියේ, අංක 40 දරන ස්ථානයේ

පදිංචි ඉන්දියානු ගමන් බලපත්‍ර අංක H 2740638 හිමි ඉරාම විරප්පන් චෙට්ටියාර්ගේ වැඩිමහල් පුත්‍රයා වන A. R. සෞන්දරරාජන් වන මා ශ්‍රී ලංකා ජනරජයේ මධ්‍යම පළාතේ, මහනුවර මහනගර සභා සීමාව තුළ මහනුවර, කටුකැලේ, පේරාදෙනිය පාරේ අංක 10/1 දරන ස්ථානයේ පිහිටා ඇති ශ්‍රී සෙල්ව විනායගර් කෝවිල සහ දේවාලගම නොහොත් පුල්ලයාර් කෝවිල අංක ARL SUNUR භාරයේ පරම්පරාවෙහි උරුම වූ භාරකරු මා බවට මා මෙයින් තහවුරු කරන අතර, වර්ෂ 2012.04.14 වැනි දින දකුණු ඉන්දියාවේ තමිල්නාඩු සිවගංගයි දිස්ත්‍රික්කයේ දේවකොට්ටයෙහි නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. රාජෙන්ද්‍රන් මහතා විසින් ලියා සහතික කරන ලද පත්‍රිරු අංක 7/145 යටතේ කොළඹ කලාප කාර්යාලයේ 2012.04.12 දින ලියාපදිංචි කරන ලද ඇටර්නි බලපත්‍රය මගින් ඉහත කී සෙල්වවිනායගර් කෝවිල සහ දේවාලගම නොහොත් පුල්ලයාර් කෝවිල ඇටර්නි සහ පරිපාලන කළමනාකරු වශයෙන් මා වෙනුවෙන් සහ මාගේ නාමයෙන් කටයුතු කිරීම සඳහා දකුණු ඉන්දියාව තමිල්නාඩු සිවගංගයි නගරයේ දේවකොට්ටයි දිසාවේ පරණ අංක 5 නව අංක 5/6 අකුලෙනා වත්ත පදිංචි (ඉන්දියන් ගමන් බලපත්‍ර අංක E 6164217) හිමි රාම විරප්පන් චෙට්ටියාර්ගේ පුතා වන විරප්පන් සුබ්‍රමනියම් යන අය (ඔහුගේ බාරේ අරණාසලම් තංගවේලු අංක 53, අනිවත්ත පාර, නුවර) වෙතට මා විසින් ලබාදුන් ඉහත කී ඇටර්නි බලපත්‍රය 2013.08.06 දින සිට බලපවත්නා පරිදි මෙයින් අවලංගු කොට නිෂ්ප්‍රභා කරන බවට සියලුම ලංකා වාසි ජනතාවටද සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙතට මෙයින් දැනුම් දෙමි.

මෙයින් ඉදිරියට ඉහත කී 2012.04.14 වැනි දිනැති ඉහත කී ඇටර්නි බලපත්‍රය යටතේ ඉහත කී වී. සුබ්‍රමනියම් මහතා විසින් කරනු ලබන සේ හෝ ක්‍රියා කරනු ලබන ඕනෑම ක්‍රියාවක් සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් නොදරන අතර පිළිනොගන්නා ඇත අනුමත නොකරමි.

වී. ආර්. සෞන්දරරාජන්.

08-837

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැනුම්දීමයි.

සමාගමේ නම : ඊ ටී එස් හෝල්ඩිංස් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 92920
සංස්ථාපනය කළ දිනය : 2013.06.06
ලියාපදිංචි කාර්යාලය : අංක 160/6/1, මෙත්සිරි මාවත, පිට්ටුගල, මාළඹේ.

ඒ. එච්. ජී. සඳුන් සාලිය,
සමාගම් ලේකම්.

08-923

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : වැප්රූට් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී බී 5127
ලියාපදිංචි ලිපිනයඃ අංක 18, ශාන්ත අන්තෝනි මාවත, කොළඹ 03.

සමාගම් අධ්‍යක්ෂවරු.

08-895

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඩේසි ලෑන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 65519
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගෝල්ෆේස් කෝට් 02, කොළඹ 03.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958

08-900/2

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඉසෙඩ් පී එම් සී ලංකා කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 93576
ලියාපදිංචි ලිපිනය : "ඇක්සස් ටවර්", අංක 278, යූනියන් ප්ලේස්, කොළඹ 02.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958

08-900/3

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ගෝල්ඩන් ෂෝස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 93865
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගෝල්ෆේස් කෝට් 02, කොළඹ 03.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958

08-900/1

---

## සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය 2013 ජූලි 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කර ඇති බව මෙයින් දන්වා සිටිමු.

සමාගමේ පැරණි නාමය : ලාෆ්ස් ඔස්ට්‍රේලියා හයර් එඩියුකේෂන් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 78696
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 14, ආර්. ඒ ද මෙල් මාවත, කොළඹ 04
සමාගමේ නව නාමය : ලාෆ්ස් හයර් එඩියුකේෂන් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

නීතිඥ කීර්ති පතිරාජ,
සමාගම් ලේකම්.

08-899

### සමාගමක තත්ත්වය වෙනස් කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ (11) 1 වගන්තිය ප්‍රකාරව සිල්වරින් මයික්‍රෝ ක්‍රෙඩිට් (පුද්.) සමාගම සිය තත්ත්වය පොදු සමාගමක් වශයෙන් වෙනස් කළ බවත්, සමාගමේ නාමයේ ඇතුලත් (පුද්ගලික්) යන වචනය එම පනතේ (8) 1 යටතේ කපා හරින බවත්, මින් ඉදිරියට සමාගමේ නාමය සිල්වරින් මයික්‍රෝ ක්‍රෙඩිට් සමාගම වන බවත් මෙයින් දන්වනු ලැබේ.

සමාගමේ නම : සිල්වරින් මයික්‍රෝ ක්‍රෙඩිට් සමාගම
ලියාපදිංචි අංකය : පී වී 65801 පී බී
ලියාපදිංචි ලිපිනය : සිල්වරින් සෙන්ටර්, අංක 271, කටුගස්තොට පාර, මහනුවර.

අධ්‍යක්ෂ.

2013 ජූලි මස 23 වැනි දින.

08-894

---

### ඇටර්නි බලය අවලංගු කිරීම

බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 691, දරන ස්ථානයේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ ශ්‍යාමලී රසාංගිකා ජයවර්ධන (770201179 වී) වන මා පන්නිපිටිය, පැලැන්වත්ත ඉද්ද උයන, අංක 326/ඒ/48 දරන ස්ථානයේ පදිංචි සචිත් තිළිණ කුරුප්පු (832637688 වී) වෙත පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් පී. එච්. කේ. එච්. තිලකරත්න මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 114 සහ වර්ෂ 2012ක් වූ මැයි 18 දිනත් දරන ඇටර්නි බලපත්‍රය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ට කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට එකී මා වෙනුවෙන් මාගේ ඇටර්නි බලකරු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ගනුදෙනුවකට මා වග නොකියන බව ද මින් දන්වා සිටිමි.

ආර්. එම්. එස්. ආර්. ජයවර්ධන.

08-892

### දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිට්ටඹුව රන්පොකුණුගම අංක A/15/B/E9/11 දරන ස්ථනයේ පදිංචි සුනීතා දහනායක (ජා. හැ. අ. 666370139 වී) වන මා විසින් දෙහිවල පැපිලියාන නැදිමාල පාරේ අංක 52/13 දරන ස්ථානයේ පදිංචි වික්‍රමතුංගගේ දහනායක යන අය මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු ලෙස පත්කරමින් අත්සන් කරන්නට යෙදුණු ප්‍රසිද්ධ නොතාරිස් නිමල් ආර්. රණවක මහතා විසින් 2008 ක් වූ ජූලි මස 03 වැනි දින ලියා සහතික කළ අංක 887 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් සියල්ලන්ටමත් මෙයින් දැනුම් දෙමි.

08-904

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

ගාල්ල, වඳුරඹ, අංක 276 ඒ, පල්ලේගෙවත්ත හි පදිංචි ඩබ්. කේ. ඩී. සූරියආරච්චි වන මම, බද්දේගම ප්‍රසිද්ධ නොතාරිස් වී. පී. ඩී. ලියනගේ විසින් 2011.11.13 වැනි දින ලියා සහතික කරන ලද අංක 2366 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය යටතේ උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, උතුරු තිරප්පනේ, ඇතුන්ගම, මලලගේ පීරිස් නලින් තුෂාර චම්පික යන අයට පවරන ලද ඇටර්නි බලය 2013.07.26 දින සිට අවලංගු කර ශුන්‍යකර බලරහිත කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ඩබ්. කේ. ඩී. සූරියආරච්චි.

2013 ජූලි මස 26 වැනි දින.

08-1052

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### මහජන බැංකුව - බම්බලපිටිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

#### වටිනා දේපළක් (බිම් කට්ටි තුනක්)

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව ඇතුළත කව්ඩාන පාරේ "කොස්ගහවත්ත" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු අයි. ඩබ්. ඩබ්. ඉන්දතිස්ස විසින් සාදන ලද 1995.07.06 දින අංක 1915 දරන පිඹුරේ සහ 1955.07.03 වැනි දින අංක 1915 ඒ දරන පිඹුරේ නිශ්චිතව දක්වා ඇති ලොට් "ඒ" සහ ලොට් "බී" ඒකාබද්ධ කර සාදන ලද උප බෙදුමක් වූ "කොස්ගහවත්ත" යන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු වන සී. ජීරසිංහ මහතා විසින් 2004.05.05 වැනි දින නැවත මැන සාදන ලද අංක 2157 දරන පිඹුරෙහි ලොට් අංක 2 ප්‍රමාණයෙන් පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) විශාල වරිපනම් අංක 140/5 ස්ථානය, සහ එම අංක 2157 පිඹුරේ ලොට් අංක 3 ප්‍රමාණයෙන් (අ. 0, රූ. 0, පර්. 8) පර්චස් අටක් ද, එම 2157 පිඹුරේ ලොට් අංක 4 ප්‍රමාණයෙන් පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්. 18) සහ ඒ මත වූ සියලු ගොඩනැගිලි ගහකොළ සහ වෙනත් සියලු දේ ද එම 2157 පිඹුරේ ලොට් අංක 5 ලෙස ලකුණු කර ඇත්තාවූ (අඩි 10ක් පළල මාර්ගයක් සඳහා වෙන් කරන ලද (පර්. 8.70) මාර්ග අයිතීන් ද සමග වේ. මෙය දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එම්. 3079/65 යටතේ ලියාපදිංචි වී ඇත.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2013ක් වූ සැප්තැම්බර් මස 21 වැනි දින (සෙනසුරාදා) පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා රජයේ ගැසට් පත්‍රයේ 2013 ජනවාරි මස 18 වැනි දි දින ද, දිනමිණ සහ ඩේලිනිව්ස් පුවත්පත්වල 2013 ජනවාරි මස 17 වැනි දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීම්වලට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - දෙහිවල සිට ගල්කිස්ස දෙසට මීටර් 400ක් පමණ යනවිට වම් පසට හමුවන කවුඩාන පාරේ මීටර් 825ක් පමණ ගියවිට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරුගේ හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග කොමිස් ගාස්තු වෙතොත් එම මුදල් ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත දී මහජන බැංකුව, සහකාර ප්‍රාදේශීය කළමනාකරු, (කොළඹ දකුණ) ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (බටහිර 01) අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01 වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2344982, 2393678, ෆැක්ස් අංකය : 4717009

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු හා තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145, 0718021206.

08-1054/1

---

**මහජන බැංකුව - දෙහිවල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ මාවිත්තර පිහිටියා වූ ද, "සම්බුද්ධි කහටගහවත්ත" යැයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. ඒ. එස්. ඒ. ගුණසේකර මහතා විසින් මැන සාදන ලද අංක 589 සහ 1999.08.15 වැනි දින දරන පිඹුරේ ලොට් අංක බී 6 ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තා වූ ද, උතුරට : (පාර සඳහා වෙන්කිරීම වන) ලොට් බී 8 ද, නැගෙනහිරට : ලොට් අංක බී 5 ද, මායිම් වන්නා වූ ද, පර්චස් නමයක් (අක්කර 0, රූ. 0, පර්. 9) විශාල වූ ද, බෙදා වෙන්කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි සහ වෙනත් සියලු දේත් ය.

ඉහත කී අංක 589 දරන පිඹුරේ, ලොට් බී 8 (අඩි 10 සිට 12 පළල පාරක් සඳහා වෙන් කිරීම වන) ලොට් බී 4 සහ අඩි පාර උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මවිසින් 2012.09.24 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2010.08.06 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2010.11.25 දිනැති දිනමිණ සහ ඩේලිනිවුස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීමේ මාර්ග විස්තර.*- කැස්බෑව නගරයේ සිට බණ්ඩාරගම පාර ඉදිරිපස ඇති මහා විහාර පාරේ කි. මී. 1ක් පමණ ගුරුපුරට ගිය පසු ගුරුපුර පාරේ මීටර් 300ක් පමණ නැවත ගිය විට දකුණු පසින් ඇති (මිහිඳු මාවත ඉදිරිපස) පුද්ගලික පාරේ මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරුගේ හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග කොමිස් ගාස්තු වෙතොත් එම මුදල් ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නුගේගොඩ, හයිලෙවල් පාර හි අංක 177 ඒ හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ පිටත) ගෙවිය යුතු ය. දුරකථන අංක 2825102- 2825101, 2817737.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු)
වෙන්දේසිකරු හා තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145, 0718021206.

08-1054/2

### පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2013 සැප්තැම්බර් මස 17 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය කොට්ඨාස අංක 40 තිඹිරිගස්යාය ටොරින්ටන් ඇවනිව් හි පිහිටි ටොරින්ටන් ඇවනිව් වරිපනම් අංක 290/1 දරන බලයලත් මානක කේ. පී. විජේවීර විසින් මැන සාදන ලද අංක 2074 සහ 2002 නොවැම්බර් මස 12 දිනැති සැලැස්මේ ලොට් ජී වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සියල්ල වේ. කොළම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1082/155 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක ජී. චන්ද්‍රසේන විසින් මැන සාදන ලද අංක 108/93 සහ 1993 දෙසැම්බර් මස 20 දිනැති සැලැස්මේ ලොට් සී (පාර සඳහා වෙන් කරන ලද බිම් තීරය) මත සහ ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ.

(ප්‍රමාණය : අ. 0 රූ. 0 පර්. 9.12)

2. බස්නාහි පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය කොට්ඨාස අංක 40 තිඹිරිගස්යාය ටොරින්ටන් ඇවනිව් හි පිහිටි ටොරින්ටන් ඇවනිව් වරිපනම් අංක 290/4 දරන බලයලත් මානක කේ. පී. විජේවීර විසින් මැන සාදන ලද අංක 2074 සහ 2002 නොවැම්බර් මස 12 දිනැති සැලැස්මේ ලොට් බී වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදි සියල්ල වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1082/157 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක කේ. පී. විජේවීර විසින් මැන සාදන ලද අංක 2074 සහ 2002 නොවැම්බර් මස 12 දිනැති සැලැස්මේ ලොට් ඒ සහ ඊ (පාර සඳහා වෙන් කරන ලද බිම් තීරය) මත සහ ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ.

(ප්‍රමාණය අ. 0 රූ. 0 පර්. 9.12)

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය කොට්ඨාස අංක 40 තිඹිරිගස්යාය ටොරින්ටන් ඇවනිව් හි පිහිටි ටොරින්ටන් ඇවනිව් වරිපනම් අංක 290/3 දරන බලයලත් මානක කේ. පී. විජේවීර විසින් මැන සාදන ලද අංක 2074 සහ 2002 නොවැම්බර් මස 12 දිනැති සැලැස්මේ ලොට් සී වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදි සියල්ල වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1082/156 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක කේ. පී. විජේවීර විසින් මැන සාදන ලද අංක 2074 සහ 2002 නොවැම්බර් මස 12 දිනැති සැලැස්මේ ලොට් ඒ සහ ඊ (පාර සඳහා වෙන් කරන ලද බිම් තීරය) මත සහ ඔස්සේ මාර්ග අයිතිය ද සමඟ වේ.

(ප්‍රමාණය : අ. 0 රූ. 0 පර්. 9.12)

දෙකම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රි විසින් සහතික කරන ලද 2009 ජූලි මස 10 දිනැති අංක 1776 සහ 1779 දින දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම ඇල්ෆා ඩිජිටල් ටෙක්නලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013.01.18 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම සුඬර්, ඔලි පුවත්පත් සහ එදිනම ගැසට් පත්‍රය ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- හැව්ලොක් පාරේ තිඹිරිගස්යාය විදුලි සංඥා කණුව හන්දියෙන් තිඹිරිගස්යාය පාරට හැරී කිලෝ මීටර 1ක් පමණ ගොස් එම පාරේ වම්පස පිහිටි ටොරින්ටන් ඇවනිව් පාරට හැරී මීටර් 75-100ක් පමණ ගමන් කොට ඉහතකී මානක සැලැස්මේ දැක්වෙන වම් පස පිහිටි පිවිසුම් මාර්ගය ඔස්සේ විකිණීමට නියමිත දේපළට ලඟාවිය හැකිය. මෙම පිවිසුම රිමෝට් කන්ට්‍රෝලරය මගින් පාලනය වන ඇලුමිනියම් රෝලර් ෂටර් දොරකින් යුතු ය.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. ප්‍රචාරක වියදම් ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 500 ද,
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු කළමණාකරු ණය අයකිරීම් නීති, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4667227/011-2565573.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර, කෝට්ටේ
දුරකථන අංක : 011-2873656, 0777-672082,
ෆැක්ස් අංකය : 011-2871184.

08-1019

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය

මොරටුව , නව ගාලු පාරේ, අංක 143/1 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් සහ කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී.

.................................*පැමිණිලිකරු.*

නඩු අංකය :
222/08/එම්.ආර්.

*එදිරිව*

01. "මලිදු ඉන්ටර්නැෂනල්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ ව්‍යාපාරයක් කරගෙන යන ගාමිණී රණසිංහ, අංක 314 ගාලු පාර, රත්මලාන.

02. මනම්පේරි මොහොට්ටිගේ ජයන්ති ධම්මිකා පෙරේරා, අංක 27, කඳවල පාර, රත්මලාන.

..............................*විත්තිකරුවන්.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ ආඥාව වර්ෂ 2012ක් වූ අප්‍රේල් මස 27 වැනි දින ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව ඉහත නම් කර ඇති විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුවට එක්ව සහ /හෝ වෙන් වෙන් ව රුපියල් අනූහත් ලක්ෂ දෙදහස් දෙසිය හැට හතරයි ශත හතර (රු. 9,702,264.04) ක මුදලක් එම මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් එම රුපියල් අනූහත් ලක්ෂ දෙදහස් දෙසිය හැට හතරයි ශත හතර (රු. 9,702,264.04) මුදල වර්ෂ 2008ක් වූ පෙබරවාරි මස 12 වැනි දින සිට තීන්දු ප්‍රකාශය එනම්, 2012 ක් වූ අප්‍රේල් මස 27 වැනි දින දක්වා වර්ෂයකට 14% බැගින් වන පොලිය සහ ඉන්පසු තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ම මුදල ගෙවා නිමවන තෙක් නෛතික පොලිය සහ නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට අණකර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තව ද, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම සහ ස්ථානය එම තීන්දු ප්‍රකාශය යටතේ අයවිය යුතු මුදල, පොලිය සහ නඩු ගාස්තු අයකර ගැනීම සඳහා බැඳි ඇති බවටත්, එය ඇස්කිසි කළ හැකි බවට වැඩිදුරටත් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2012ක් වූ අප්‍රේල් මස 27 වැනි දින කොළඹ දී පැවැත්වූ බස්නාහිර පළාත්බද (වාණිජ) මහාධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ මොරටුව ලක්ෂපතියේ යන ස්ථානයේ දී 2013ක් වූ සැප්තැම්බර් මස 12 වැනි දිනන පෙ. ව. 11.30 පැයට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ ලක්ෂපතියේ පිහිටි "කුට්ටේරියාවල එස්ටේට්" හෙවත් "මොරටුව සිනමන් ගාඩ්න්ස්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ජේ. ජයවික්‍රම මහතා විසින් වර්ෂ 1994ක් වූ ජනවාරි මස 25 වැනි දින මැන සාදන ලද අංක 458 දරන පිඹුර ප්‍රකාර මැන සකස් කරන ලද ඉඩමට මායිම්, උතුරට : පිඹුරු අංක 131 ප්‍රකාර ලොට් අංක ඒ දරන කොටස සහ පිඹුරු අංක 1250 හි ලොට් 01 දරන කොටස ද, නැගෙනහිරට : පිඹුරු අංක 1250 හි ලොට් අංක 01 සහ පාර (අඩි 20) ක් පළල) ද, දකුණට : අඩි 20ක් පළල පාර ද, බස්නාහිරට: පිඹුරු අංක 1250 හි ලොට් අංක 03 සහ පිඹුරු අංක 131 හි ලොට් ඒ දරන කොටසෙහි කොටසක් ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහඅට (අ. 0 රූ. 0 පර්. 18) ක් විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි අංග සම්පූර්ණ දෙමහල් නිවස, ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේද වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2491/44 හි ලියාපදිංචි කර ඇත.

පහත පරිදි මාර්ග සඳහා වෙන් කිරීම :

(1) මොරටුව සිනමන් ගාඩ්න්ස් නමැති ඉඩම බලයලත් මානක ඩී. ජේ. නානායක්කාර මහතා විසින් මැන සාදන ලද අංක 1250 දරන පිඹුරේ ලොට් ඒ ප්‍රවේශය (මාර්ගය සඳහා වෙන් කළ කොටස) මායිම්, උතුරට : ලොට් 1 සහ 4 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : 131 පිඹුරේ ලොට් 5, 6, 8, 9 බී සහ ජේ ද, බස්නාහිරට : 1250 දරන පිඹුරේ ලොට් 4 සහ 5 දරන කොටස් ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසි හතර (අ. 0 රූ. 0 පර්. 24) විශාල ඉඩම වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්886/260 හි ලියාපදිංචි කර ඇත.

(2) මොරටුව පිහිටි කුට්ටේරියවල එස්ටේට් නමැති ඉඩමට සාදන ලද 1250 දරන පිඹුරේ ප්‍රකාර ලොට් බී (ප්‍රවේශ මාර්ගය සඳහා වෙන් කළ කොටස) ට මායිම්, උතුරට : ලොට් ඒ ද, නැගෙනහිරට : ලොට් 9 ද, දකුණට : ලොට් 10 ද, බස්නාහිරට : ලොට් 7 සහ 8 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තුනන (අ. 0 රූ. 0 පර්. 3) ක් විශාල ඉඩම වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 886/07 හි ලියාපදිංචි කර ඇත.

(3) කුට්ටේරියවල එස්ටේට් යන මොරටුව සිනමන් ගාඩ්න්ස් නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එච්. එල්. එම්. සිල්වා මහතා විසින් මැන සාදන ලද අංක 131 දරන පිඹුර ප්‍රකාර ලොට් ජී 2 වශයෙන් ලකුණු කළ කොටසට මායිම්, උතුරට : 131 පිඹුරේ ලොට් ඒ. බී. 02 ඊ සහ එෆ් ද, නැගෙනහිරට : කොළඹ සිට ගාල්ල දක්වා දිවෙන පී. ඩබ්. සී. පාර ද, දකුණට : ලොට් ජී 2, අයි සහ එච් ද, බස්නාහිරට : 131 දරන පිඹුරේ ලොට් ඒ (ගරාජය) ද, මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් එකොළහයි දශම නවය (අ. 0 රූ. 1 පර්. 11.9) ක් විශාල ඉඩම වේ.

*ඉඩමට පිවිසීම.* - කොළඹ ගාලු පාරේ, තෙලවල හංදිය පසුකර මීටර් 200ක් ගිය විට දකුණු පසට ඇති ගාඩ්න් සිටි පාර හමු වේ. එම පාරේ මීටර් 500ක් පමණ ගිය විට මෙම ඉඩම සහ අංග සම්පූර්ණ දෙමහල් නිවස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) වෙන්දේසිකරු වෙත එවෙලේ ම ගෙවිය යුතු ය,
02. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු රු.11,000,
03. සියලුම ප්‍රචාරක වියදම්,
04. ගමන් ගාස්තු (බිල්පත් ඉදිරිපත් කරමි),
05. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 අනුව දේපළ විකුණුම් මුදලින් රු. 7,500 දක්වා රු. 150 මුදලක් ද, වැඩි වන රු. 1,000 සඳහා රු. 5 බැගින් ගෙවිය යුතු යි.
06. රජයේ ගාස්තු හෝ පළාත් සභා ගාස්තු,
07. ලිපිකරු, සෝෂක ගාස්තු රු. 4,500,
08. ඉතිරි සියයට හැත්තෑපහ (75%) මුදල දින 30ක් ඇතුළත බස්නාහිර පළාත්බද කොළඹ වාණිජ මහාධිකරණයේ අදාළ ගිණුමට තැන්පත් කළ යුතුයි.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

ඉන්දු හේවාවිතාරණ,
බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණ
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු, වෙන්දේසිකරු, සාම විනිසුරු.

නීති නිලධාරිනී,
හැටන් නැෂනල් බැන්ක් පී එල් සී,
ප්‍රධාන කාර්යාලය, 18 වැනි මහල,
අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
දුරකථන අංක 011-2661821, 0777587010.
ෆැක්ස් අංකය : 2662831.

අංක එච් 1/16, සාංචිආරච්චි වත්ත,
කොළඹ 12.
දුරකථන අංක : 0724459575, 0722580932.

08-1040

---

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය

සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්,
අංක 84, රජවීදිය, මහනුවර.

........................*පැමිණිලිකරු.*

*-එදිරිව-*

නඩු අංකය : එච්සී (සිවිල්) 194/2001(1)

මුන්නිපුරගේ පියසීලි
168, නුවර පාර, පස්යාල,
මියගිය මහගමගේ ගුණවර්ධන යන අයගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකාරිය වශයෙන්,

................................*විත්තිකාරිය.*

ඉහත අංක දරන නඩුවේ 2009 මාර්තු මස 02 වැනි දින සමථ තීන්දු ප්‍රකාශය අනුව මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරී පත්‍රය අනුව ඉහත කී විත්තිකාරියගෙන් පැමිණිලිකාර සමාගම වෙත රුපියල් 9,537,708.60 මුදලක් හා ඒ මත 2001.08.20 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වසරකට 12% ක අනුපාතිකයකට බැගින් පොළිය ද, තීන්දු ප්‍රකාශයේ දිනට පසුව සම්පූර්ණයෙන් ගෙවන දින දක්වා තීන්දු ප්‍රකාශයේ සමස්ත මුදලට එම අනුපාතිකයටම පොළිය වශයෙන් මුදල් අයකර ගැනීමට පැමිණිලිකරු හට ආඥා කර ඇති බැවින් එකී මුදල විත්තිකාරියගෙන් අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ එකී ඉඩම හා පරිශ්‍රය එය පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මා වෙත නියෝග කර ඇති හෙයින් කොළඹ වාණිජ මහාධිකරණයේ නඩු තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට විත්තිකාරිය අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේදී වර්ෂ 2013ක් වූ සැප්තැම්බර් මස 26 වැනි දින ප. ව. 2.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සීමාව තුළ සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ නිට්ටඹුව සහ නාපාගොඩ ද යන ගම්වලට ඇතුළත් ව පිහිටා තිබෙන දෙල්ගහවත්ත සහ බටදොලේ එස්ටේට් කියන ඉඩමේ අංක 12 දරන ඒකාබද්ධ වූ කොටසෙන් බෙදා වෙන් කළ කැබැල්ලට ආර්. ඒ. චන්ද්‍රරත්න බලයලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 1991.04.24 වැනි දින මැන සාදන ලද අංක 5010 දරන ප්ලෑනයේ ප්‍රකාර මායිම්,

උතුරට : ලියනෝරා සිල්වාට අයිති ඉඩම ද,
දකුණට : බටදොලේ වත්ත ද
නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද,
බස්නාහිරට : කුඹුර ද.

මෙහි රූඩ් එකකුත්, පර්චස් තිස් දෙකකුත් දශම පහක් (අ. 0, රූ. 1 පර්. 32.5) විශාල ඉඩම සහ එහි තුළ දැනට පවතින ගොඩනැගිලි ඇතුළුව ඊට අයිති ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද,

ආර්. ඒ. චන්ද්‍රරත්න මිනින්දෝරු තැනගේ අංක 4950 සහ 1991.02.14 දිනත් දරන ප්ලෑනයේ සඳහන් අංක 7 දරන පාර පාවිච්චි කිරීමේ අයිතිවාසිකම් ද වේ.

*ඉඩමට පිවිසීම.-* නිට්ටඹුව නගර මධ්‍යයේ ඔරලෝසු කණුව හන්දියේ සිට මීටර් 500ක් පමණ නුවර පාරේ ගමන් කොට ටයිල්ස් ආයතනය ඉදිරිපසින් ඇති රබර්වත්ත පාරේ මීටර් 200ක් පමණ ගෙස් එම පාර අවසානයේ අදාළ විෂය වස්තුවට ළඟා විය හැකිය.

*ගෙවීමේ ක්‍රමය. -* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ඉඩම මිලදී ගත් වහාම ගෙවිය යුතු අතර, ඉතිරි 75% ක මුදල දින 30ක් ඇතුළත දී කොළඹ වාණිජ මහාධිකරණයේ තැන්පත් කළ යුතු ය.
2. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු,
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු 5%,
5. වෙන්දේසිකරුගේ ගමන් ගාස්තු,
6. ලිපිකරු සහ සෝෂක ගාස්තු,
7. ප්‍රාදේශීය සභා ගාස්තු වෙන්දේසි මුදලින් 1%.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

පියරත්න මුතුකුමාරණ,
තක්සේරුකරු, වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

අංක 156 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777 378441, 071-4424478,
0112 337707.

චමින්ද හෙට්ටිආරච්චි මහතා,
නීති නිලධාරී,
සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්,
අංක 270, චොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
දුරකථන අංක : 2300555.

08- 1008

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දිසා අධිකරණයේ දී ය

මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්, ලංකා බැංකු මර්චන්ට් කුළුණ, 11 වැනි මහල, අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 3.

..........................*පැමිණිලිකරු.*

නඩු අංකය :
DMB/ 00031/12.

*-එදිරිව-*

හේවා ෆොන්සේකාගේ ජයසිරි නිමල් ෆොන්සේකා,
අංක 132/ඩී, පුන්‍යානන්ද මාවත,
දිබැද්ද,
පානදුර.

............................*විත්තිකරු.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරී පත්‍රය අනුව වර්ෂ 2012ක් වූ මැයි මස 02 වැනි දින ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව ඉහත නම් කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු,

*(අ)* කාලීන ණය අංක KB/TL/2197 2011.08.26 වැනි දිනට රු. 1,219,186.72 ක මුදලක් සහ 2011.08.27 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් කරනු ලබන තෙක් මසකට 4% බැගින් පොළිය ද සමග අයකර ගැනීම සඳහා පැමිණිලිකරු හිමිකම් ලබන බවට මෙයින් අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින්ද,

*(ආ)* මෙහි වූ උපලේඛනයෙහි විස්තර කොට ඇති මුළු ඉඩම් කැබලි (මෙහි මින්මතු "උකස් කරන ලද දේපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ මත පිහිටි ගොඩනැගිලි හා ව්‍යුහයන්ද, එකී උකස් කරන ලද දේපළ විෂයෙහි, එයින් එයට හෝ ඒ මත සියලු ඉඩකඩම්,න අයිතිවාසිකම්, හිමිකම්, දේපළ සම්බන්ධතා, හිමිකම් පෑම් හා ඉල්ලීම් ද, සමග කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සී. පොන්නයියා මහතා විසින් ලියා සහතික කරන ලද අංක 952 හා 2009.04.21 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය යටතේ හා ඒ ප්‍රකාර ඉහත කී මුදල් අයකර ගැනීම පිණිස බැඳී ඇති බවට හා ක්‍රියාවෙහි යෙදවිය හැකි බවට සහ ඉහත කී මුදල් අයකර ගැනීම අරඹයා එකී උකස් බැඳුම්කරය ක්‍රියාවෙහි යෙදවීමට පැමිණිලිකරු හිමිකම් ලබන බවට මෙයින් අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

*(ඇ)* එකී මුදල් නඩු ගාස්තු සමග තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස දෙකක කාලයක් ඇතුළත පැමිණිලිකරුට ගෙවන ලෙසට විත්තිකරුට අණකොට තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2012ක් වූ මැයි මස 02 වැනි දින කොළඹ දිසා අධිකරණ සමථ නඩු තීන්දුව ඉටුකිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ අංක 212/ඩී[1] වෙන්දේසිවත්ත, දිබැද්ද, පානදුර යන ස්ථානයේදී වර්ෂ 2013ක් වූ ඔක්තෝබර් මස 01 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිට දිබැද්ද, පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ දිබැද්ද ගමේ දිබැද්ද එස්ටේට් නමැති ඉඩමට වර්ෂ 2008 සැප්තැම්බර් මස 01 වැනි දින එච්. පී. ඒ. ජයවික්‍රම බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 11532 දරන පිඹුරේ කැබලි අංක ඒ ට මායිම් උතුරට : පිඹුරු අංක 625 දරන පිඹුරේ කැබලි අංක 50 නැගෙනහිරට එම් ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු සහ සොලමන් සිල්වා යන අයට අයත් ඉඩම් ද, දකුණට : පිඹුරු අංක 625 දරන පිඹුරේ කැබලි අංක 52 සහ 53 බටහිරට : පිඹුරු අංක 625 දරන පිඹුරේ කැබලි අංක 65 සහ දැනට වෙන්දේසිවත්ත පාර යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) සහ හෙක්ටයාර් 0.05059 විශාලත්වයෙන් යුතු ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සියලු දේ ද වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 589/145 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

පහත විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ. පානදුර තල්පිට දිබැද්ද පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ දිබැද්ද ගමේ දිබැද්ද එස්ටේට් නමැති ඉඩමට වර්ෂ 1961 ජනවාරි මස 24, 26 සහ 26 දින ඩී. ජේ. නානායක්කාර බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 625 දරන පිඹුරේ කැබලි අංක 65 ට මායිම්, උතුරට : කැබලි අංක 23 සිට 29 සහ අංක 36 සිට 40 අංක 52 සිට 53 අංක 58 සිට 64 අංක 76 සිට 82 සහ අංක 48 ද, නැගෙනහිරට : එම් ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු යන අයට අයත් ඉඩම සහ අංක 50, 51, 53, 54, 64, 57, 75, 69, 82, 86 සහ 92 ද, දකුණට : කැබලි අංක 30 සිට 35 අංක 66 සිට 74 අංක 54 සිට 56 අංක 64 සහ අංක 86 සිට 92 ද, සහ බටහිරට : ගම්සභා පාර කැබලි අංක 68 සහ අංක 83 සිට 85 අංක 39 සිට 41 අංක 49 34 සිට 35 යන මායිම් තුළ පිහිටි අක්කර එකයි පර්චස් දහයක (අ. 1, රූ. 0, පර්. 10) මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 521/240 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

*ඉඩමට පිවිසීම.* - කොළඹ සිට පානදුර නගරයට පැමිණ ඔරලෝසු කණුව පසුකර ගාළු පාරේ කිලෝමීටරයක් පමණ ගොස් වම්පසින් ඇති දෙබැද්ද රණවිරු මාවතේ මීටර් 400ක් පමණ ගිය විට අදාළ ලොට් ඒ ඉඩම වම්පසින් පිහිටා ඇත. එහි දැන් වරිපනම් අංකය 212/ඩී [1] නම් වේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%),
02. නොතාරිස් ගාස්තු ගමන් ගාස්තු සහ විකුණුම් කොන්දේසි සකස් කිරීමේ ගාස්තු රු. 10,500,
03. සියලුම ප්‍රචාරක වියදම්,
04. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
05. රජයේ ගාස්තු හෝ පළාත් සභා ගාස්තු,
06. ලිපිකරු හා සෝෂක ගාස්තු රු. 4,500,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහ (75%) මුදල දින 30ක් ඇතුළත දී කොළඹ දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතු ය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,

අංක 182, 3 වැනි මහල, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය 011-2445393,
දුරකථන අංකය : 011-2396520,
ඊමේල් : senaservice@sltnet.lk

සී. ඩී. බක්මීවැව,
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්,
මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්,
11 වැනි මහල, ලංකා බැංකු මර්චන්ට් කුළුණ,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2301501, (783)
ෆැක්ස් අංකය : 011-4627850.

08-1046

---

## සෙලාන් බැංකුව පීඑල්සී - හලාවත ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ මාදම්පේ පදිංචි රුක්මන් උදය ශාන්ත නාරාසිංහ යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, උතුරු පිටිගල් කෝරලේ, මුන්නේස්වරම් පත්තුවේ කරුක්කාව පිහිටි කරුක්කාව වලව්ව එස්ටේට් නමැති ඉඩමේ 2007.08.02 වැනි දින බලයලත් මිනින්දෝරු වර්නන් පෙරේරා විසින් ලොට් ඒ 1 හි උද්ධෘතය නිවැරදි දැයි බලන ලද සහ ඒ. එම්. පෙරේරා විසින් සාදන ලද 1951.12.31 වැනි දිනැති අංක 4030 දරන සැලැස්මේ නිරූපනය වන ලොට් ඒ 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද අක්කර හයයි, රූඩ් දෙකයි, පර්චස් දෙකක් (අ. 06, රූ. 02, පර්. 02) ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2013 සැප්තැම්බර් මස 18 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - මාදම්පේ නව නගරයේ සිට හලාවත පාර ඔස්සේ කි. මී. 1.4ක් පමණ ගිය විට හමුවන සුගතානන්ද මහා විද්‍යාලය ද, පසුකර තවත් මීටර් 60ක් පමණ ගිය විට ප්‍රධාන මාර්ගයට මුහුණ ලා මාර්ගයේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ* 2013.05.17 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2013.05.17 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2013.05.15 වැනි දින ද, පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද, විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 2456477, 2456487.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව,
දුරකථන අංක 011- 3068185, 011- 2572940.

08-931

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - අම්පාර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අම්පාර සුළු නගර සභා සීමාවන් තුළ අම්පාර (ජී කලාපයේ) පිහිටි මණ්ඩලයට අයත් යැයි කියන ලද ඉඩමට මිනුම්පති විසින් 2007.07.31 වැනි දින පිළියෙල කරන ලද අංක 280007 දරන කඩස්තර සිතියමේ සඳහන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 31 දරන ඉඩම හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 10.79

මෙම දේපළ සුදේශ් කුසුමේන්ද්‍ර දළුවත්ත යන අය බන්ධනදායී වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.*- අම්පාර ඔරලෝසු කණුව හන්දියේ සිට ඩී. එස්. සේනානායක වීදියේ රිගල් හන්දිය දක්වා ගමන් ගෙන දකුණට හැරී 4 වන පටුමගට පිවිස මීටර් 50ක් පමණ ගිය විට මෙම පටුමගේ දකුණු පසින් පාරට මුහුණ ලා අදාළ දේපළ පිහිටා තිබේ.

2013 ක් වූ සැප්තැම්බර් මස 20 වැනි දින පෙ.ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.07.05 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2013.07.08 වැනි දින ඩේලිමිරර්, ලක්බිම හා තිනකරන් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836, 011-2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 081-2210595, 071- 4755974, 071- 8446374, 077-7761706.

08-949

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ දැන්වීම

ණයකරු - පාදුක්ක, අංගම්පිටියේ, ඉසෙඩ්. එම්. විෂන් (පුද්.) ආයතනය

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය යටතේ ප්‍රසිද්ධ කළ යෝජනාවට අනුව 2013.07.19 දිනැති අංක 1820 දරන ගැසට් පත්‍රයේ හා 2013.07.04 දිනැති "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2013.09.28 වැනි දින පෙ. ව. 11.00 ට කොළොන්නාව විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### ඉහත සඳහන් උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළයේ, උඩ පත්තුවේ, කුරුවිට ප්‍රාදේශීය සභා සීමාව තුළ මතුවගල ග්‍රාමයේ පිහිටි "මුතුවගලවත්ත (කොටස) සහ බංගලාවත්ත (කොටස)" සහ නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි ගහකොළ සහ වෙනත් සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ජී. විජේසිංහ විසින් සාදන ලද 1993 දෙසැම්බර් මස 02 වැනි දිනැති (එහෙත් 1993 දෙසැම්බර් මස 12 ලෙස ලියාපදිංචි වී ඇති) අංක 426 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 අංක එෆ්. වී. පී. 325 දරන පිඹුරෙහි ලොට් 213 (එහෙත් අංක එෆ්. වී. පී. 325 දරන පිඹුරෙහි ලොට් 213 සහ බංගලාවත්තේ කොටසක් ලෙස ලියාපදිංචි කර ඇති) ද, නැගෙනහිරට : බංගලාවත්ත (එම ඉඩමේ ම කොටස) ද, දකුණට : පානදුර-රත්නපුර මහා මාර්ගය ද, බස්නාහිරට: අංක එෆ්. වී. පී. 325 දරන පිඹුරෙහි ලොට් 213 ද, මායිම්ව එකී අංක 426 දරන පිඹුරට අනුව අක්කර හතරයි රූඩ් දෙකයි පර්චස් දෙකයි දශම තුනයි බිංදුවක (අ. 4, රූ. 2, පර්. 2.30) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර, මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 677/264 හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 1 බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ජී. විජේසිංහ විසින් මෑතක දී මැන සාදන ලද 2007 අගෝස්තු මස 07 දිනැති අංක 3361 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී මතුවගල පිහිටි "මුතුවගලවත්ත (කොටස) සහ බංගලාවත්ත (කොටස)" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද ඇතුළත් ව බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ජී. විජේසිංහ විසින් සාදන ලද 2007 අගෝස්තු මස 7 දිනැති අංක 3361 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : එෆ්. වී. පී. 325 හි ලෙට් 213 සහ බංගලාවත්ත ද, නැගෙනහිරට : බංගලාවත්ත ද, දකුණට : පානදුර සිට රත්නපුර දක්වා මහා මාර්ගය ද, බස්නාහිරට : එෆ්. වී. පී. 325 හි ලොට් 213 ද මායිම්ව, එකී අංක 3361 දරන පිඹුරට අනුව අක්කර හතරයි රූඩ් දෙකයි පර්චස් දෙකයි දශම තුනයි බිංදුවක (අ. 4 රූ. 2 පර්. 2.30) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. චන්ද්‍රපාල,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
නුගේගොඩ.

08-939

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 835 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර සහ කඩවත් සීමාවට අයත්, ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙල්ලෙමනල් ප්‍රාදේශිය සභා (උප) සීමාවට අයත් වයිනා බේ. නීරොට්ටුමුනෛහි පිහිටි නීරොට්ටුමුනෛ ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු සහ මට්ටම්කරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1967 පෙබරවාරි මස 08 වැනි දිනැති අංක 1239 දරන පිඹුරේ ලොට් අංක 50 සහ 51 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටි සහ එහි පිහිටි ගස්වැල්, වගාවන් සහ සියල්ල ද සමග ඊට අයත් සියලුම අයිතීන් සහිතව. පිළිවෙලින් අක්. 0 රූ. 0 පර්. 20 සහ අක්. 0 රූ. 0 පර්. 20 ප්‍රමාණයන් වන අතර, ඉහත කී අංක 1239 දරන පිඹුරේ ඇති මාර්ගය පදික ගමන් සහ වාහන ගමන් සඳහා භාවිතා කිරීමේ අයිතිය ද සමග.

ඉහත කී ලොට් අංක සහිත ඉඩම් කට්ටි ඒකාබද්ධ කර තනි ලොට් අංකයක් ලෙස නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර සහ කඩවත් සීමාවට අයත් ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ත්‍රිකුණාමලය ප්‍රාදේශීය සභා සීමාවට අයත් වෙල්ලෙමනල් නීරාට්ටුමුනෛහි පිහිටි අංක 581/10, මඩකලපුව පාර, ත්‍රිකුණාමලය යන ලිපිනය දරන බලයලත් මිනින්දෝරු සහ මට්ටම්කරු එන් ෆාරූක් විසින් සාදන ලද 2010 දෙසැම්බර් මස 02 වැනි දිනැති අංක 0030 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වේ.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 0 පර්. 30.68

ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ නොතාරිස් තිලගරත්නම් තුෂ්යන්තන් විසින් සහතික කරන ලද 2011 ජනවාරි මස 11 වැනි දිනැති අංක 835 දරන උකස්කරය ප්‍රකාර, වත්තල සහ ත්‍රිකුණාමලයේ පදිංචි ලොරෙන්සු හේවගේ සරත් විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2013 සැප්තැම්බර් මස 17 වැනි දින (අඟහරුවාදා පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. රු. 1,28,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2442442.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 121 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1892.com.

වෙබ් අඩවිය :www.sandslanka.com

08-1031

---

**මහජන බැංකුව - ආයතනික ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ලියනගේමුල්ල, සීදූව**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසයට අයත්, කටුනායක සීදූව නගර සභා සීමාවට අයත් ලියනගේමුල්ල ග්‍රාමයේ පිහිටි, කුරුවේමුදියන්සේලාගේ කුරුදුවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද 2003 ජනවාරි මස 30 වැනි දිනැති අංක 9082 ඒ දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ්. 0 පර්. 20 (හෙක්ටයාර 0.0506)
එහි පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියල්ල සහිතව

පහත දැක්වෙන බිම් කට්ටිය හරහා වැටී ඇති මාර්ග අයිතිය ද සමග :

ලියනගේමුල්ල ග්‍රාමයේ පිහිටි, කුරුවේමුදියන්සේලාගේ කුරුදුවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් සාදන ලද 1986 නොවැම්බර් මස 27 වැනි දිනැති අංක 2586 දරන පිඹුරේ ලොට්

අංක ඩී ලෙස දැක්වෙන (අඩි 15ක් පළල මාර්ගයක් සඳහා වෙන්කර ඇත) සීමා නිර්ණයකර බෙදාවෙන් කරන ලද බිම් කට්ටිය.

*දේපළ වෙත පිවිසීම.* - කොළඹ සිට කොළඹ-මීගමුව ප්‍රධාන පාරේ කිලෝමීටර් 15ක් පමණ ගොස් සීදුව මංසන්ධියට පැමිණ එතැන් සිට කිලෝමීටර් 2ක් පමණ එම මාර්ගයේ ම ගොස් එයාර්පෝට් ගාඩ්න් හෝටලය දක්වා පැමිණෙන්න. අදාළ දේපළ එම පාරේ දකුණු පසින් පිහිටා ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2013 සැප්තැම්බර් මස 13 වැනි දින (සිකුරාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අදාළ දේපළ සී/ස දයාරත්න සහ සමාගම (පුද්ගලික) විසින් මහජන බැංකුවට උකස් කරන ලද්දකි.

*තීරණය පිළිබඳ* දැන්වීම සඳහා කරුණාකර 2009 අගෝස්තු මස 28 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්)
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර)
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකරු - අයකර ගැනීම්, ආයතනික බැංකු ශාඛාව, මහජන බැංකුව, අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 වෙත ගෙවිය යුතු වේ. දුරකථන අංක 2320651-6/2423733.

ඔප්පුව පිළිබඳ සහ අනෙකුත් විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුලත ඉහත සඳහන් කරන ලද මුළු මුදල් ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 121 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1892.com

වෙබ් අඩවිය :www.sandslanka.com

08-1032